එක්සත් ජාතීන්ගේ
ආහාර හා කෘෂිකර්ම
සංවිධානය

NAFSO

ජාතික ධීවර
සහයෝගිතා
ව්‍යාපාරය

## ආහාර සුරක්ෂිතතාව හා දුප්පත්කම දුරැලීමේ සන්දර්භය තුළ

# තිරසර සුළුපන්න ධීවර කර්මාන්තයේ සුරක්ෂිතතාව සඳහා වන ස්වේච්ඡා මග පෙන්වීම්



# ආහාර සුරක්ෂිතතාව හා දුප්පත්කම දුරැලීමේ සංදර්භය තුළ,

# තිරසර සුළු පන්න ධීවර කර්මාන්තයේ සුරක්ෂිතතාව සඳහා වන ස්වේච්ඡා මග පෙන්වීම්

Published by arrangements with the
Food and Agriculture Organization of the United Nation
By the
National Fisheries Solidarity Movement [NAFSO]

i. මෙහි මුල්කෘතිය එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත්කරනු ලැබීය. මෙම සිංහල අනුවාදය ජාතික ධීවර සහයෝගීතා ව්‍යාපාරය [NAFSO] විසින් සකසනු ලැබිණ. මෙහි අන්තර්ගතයෙහි ව්‍යෘකූලතාවක් ඇතියැයි හැඟෙන අවස්ථාවක ප්‍රකාශනයේ මුල් භාෂාවෙහි අර්ථය බලපවතී.

ii. මෙම පොතේ ඉදිරිපත් කර ඇති තොරතුරු වල අදහස් කිසිවක් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ස්ථාවරයන් නියෝජනය නොකරයි. එමෙන්ම කිසියම් රටක, භූමි ප්‍රදේශයක, නගරයක හෝ ඒවායේ බල අධිකාරියක නීතිමය හෝ සංවර්ධන තත්වයන් හෝ ඒවායේ සීමා සහිතවීම් හෝ සීමා මායිම් සැලකිල්ලට නොගනී මෙම පොතේ විශේෂ සමාගම් හෝ නිෂ්පාදනයකට අදාල ව පේටන්ට් බලපත්‍ර ඇතත් නොමැතිවුවත් අනිකුත් සමාන නිෂ්පාදන හෝ සමාගම් යටපත් කරමින් ඒවා අනුමත කිරීමක් හෝ නිර්දේශ කිරීමක් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සිදුකර නැත. මෙම පොතේ අඩංගු කරුණු එය ප්‍රකාශයට පත්කළ පොතේ කර්තෘ ගේ ඒවා මිස, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අදහස් නියෝජනය වීමක් කිසිසේත් ම නොමැත.

iii. © ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය [NAFSO], 2015, (සිංහල පරිවර්තනය)
© FAO, 2015 (English edition)

iv. **ISBN No: 978-955-8103-25-8**



**මෙම මගපෙන්වීම් මාලාව සැකසීමට උරදුන් චන්ද්‍රිකා ශර්මා සහෝදරිය පිළිබඳ සටහනක් :**

2008 ඔක්තෝබර් මස බැංකොක් නුවර පැවති තිරසර ධීවර කර්මාන්තයක් සුරක්ෂිත කිරීමේ ගෝලීය සමුළුවේ සිට, තිරසර සුළුපන්න ධීවර කර්මාන්තයක් සුරක්ෂිත කිරීම සඳහාවන ස්වේච්ඡා මගපෙන්වීම් මාලාව 2014 ජුනි මස 13 දින ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර කමිටුවේ දී සම්මත කර ගැනීම දක්වා අති දැවැන්ත සිවිල් ක්‍රියාකාරිත්වයක් ගෝලීය වශයෙන් සංවිධානය කරන ලදී. මේ සඳහා සුළුපන්න ධීවර කර්මාන්තයේ උන්නතිය උදෙසා වෙහෙසෙන සිය ගණනක් ධීවර, මානව හිමිකම් හා පරිසර සංවිධාන, වෘත්තීය සමිති මෙන් ම ගෝලීය ව්‍යාපාර විශාල දායකත්වයක් දක්වන ලදී.

රටවල් 20 ක සිවිල් සංවිධාන මේ පිළිබඳ ජාතික වැඩපිළිවෙලක් දියත් කර සුළුපන්න ධීවරයාට තම රටේ දී ඇති වැදගත්කම පිළිබඳ වාර්තා සැකසූ අතර මේ සියල්ල ඒකරාශි කර ජාත්‍යන්තර සිවිල් සංවිධාන විශ්ලේෂණ වාර්තාව සැකසීම සඳහා විශාල කාර්යභාරයක් චන්ද්‍රිකා ශර්මා සහ ධීවර කාර්මිකයින්ගේ සහාය සඳහාවන ජාත්‍යන්තර සාමූහිකය සිදුකරන ලදී.

ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය මෙම ක්‍රියාවලියේ දී සිදුකරන ජාතික කලාපීය හා ජාත්‍යන්තර මැදිහත්වීම් වල දී චන්ද්‍රිකා සොයුරියගේ සහය අපි අගය කරමු. මෙම ක්‍රියාවලියට නායකත්වය දෙමින් ඇය ඉටුකළ මෙහෙය සුළුපන්න ධීවර කාර්මිකයින් මෙන් ම එකී සංවිධානවලට ද සදා සිහිපත් වනු ඇත.

2013 ජුනි මස දී හා 2014 පෙබරවාරි මස ඉතාලියේ රෝම නගරයේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සංවිධානය කළ මෙම මගපෙන්වීම් මාලාව පිළිබඳ රාජ්‍ය ආයතන අතර පැවති තාක්ෂණික උපදේශණ මාලාවට සිවිල් සංවිධාන ජාලයට නායකත්වය දෙමින් චන්ද්‍රිකා සොයුරිය සහභාගි විය නමුත් 2014 ජුනි මස මෙම මගපෙන්වීම් මාලාව සම්මත කර ගැනීමට පැවති අවසාන තාක්ෂණික උපදේශන කමිටුවට ඇය සමග එක්වීමට භාග්‍යයක් අපහට නොලැබිනි.

මොන්ගෝලියාවේ "ඉලන්බත්තූර්" හි පැවති සමුළුවකට සහභාගිවීම සඳහා අනපේක්ෂිත අයුරින් අතුරුදහන් වූ MH 370 යානයෙන් පිටත් වූ චන්ද්‍රිකා සොයුරියට නැවතත් අප සමග එක්වීමට ඉඩක් නොතබාම අප සියල්ලන් කඳුලෙන් නහවා ඇයද අතුරුදහන් විය. සුළුපන්න ධීවර ක්ෂේත්‍රයට විශේෂයෙන් එම ක්ෂේත්‍රයේ කාන්තාවන්ට සිදුවූ පාඩුව නිමක් නැත මෙය අප විශේෂයෙන් අත්දැක්කේ 2014 ජුනි මස සුළුපන්න ධීවර කර්මාන්තයක් සඳහා මගපෙන්වීම් මාලාව සම්මත කර ගැනීමට යළිත් රැස් වූ අවස්ථාවේ දී ය නමුත් සියල්ල සිදුව හමාරවී ඇත චන්ද්‍රිකා සොයුරිය මේ මොහොතේ අප අතර නැත.

චන්ද්‍රිකා සොයුරිය අතුරුදහන් වීමෙන් සිදු වූ පාඩුව ධීවර ක්ෂේත්‍රයට විශේෂයෙන් සුළුපන්න ධීවර ක්ෂේත්‍රයට ඉදිරියේ දී වඩාත් දැනෙනු ඇත. එයටත් වඩා චන්ද්‍රිකා ඇසුරු කළ පිරිසට දැනෙන කම්පනය 2014 ජුනි මස රෝමයට රැස් වූ පිරිසට දැනිනි. සහෘදයන්ගේ ඉල්ලීමට කන්දුන් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර කමිටුව සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවය සුරක්ෂිත කිරීම සඳහාවන ස්වේච්ඡා මගපෙන්වීම් මාලාව චන්ද්‍රිකා ශර්මා සොයුරියගේ නමින් නම්කර සම්මත කරන ලදී.

## ආහාර සුරක්ෂිතතාව හා දුප්පත්කම දුරැලීමේ සංදර්භය තුළ,

# තිරසර සුළුපන්න ධීවර කර්මාන්තයේ සුරක්ෂිතතාව සඳහා වන ස්වේච්ඡා මග පෙන්වීම්

මාර්ගෝපදේශනයන්ගේ අත්‍යන්ත අරමුණ වන්නේ සුළුපන්න ධීවර කර්මාන්තය, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය වෙත දක්වන දායකත්වය වැඩිකිරීම, ආහාර අයිතිය ප්‍රගතිගාමී ලෙස සාක්ෂාත් කර ගැනීමට සහාය දැක්වීම හා තීරණ ගැනීමට සහභාගි වීමට, සිය මානව හිමිකම් භුක්ති විඳීමට සහ ධීවර සම්පත්වල තිරසර භාවිතය සඳහා වගකීම් ආරෝපණ කිරීම වෙත සුළුපන්න ධීවර ප්‍රජාව බලගැන්වීම වේ.

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය 2015, රෝමය**

# ආහාර සුරක්ෂිතතාව හා දුප්පත්කම දුරැලීමේ සංදර්භය තුළ, තිරසර සුළුපන්න ධීවර කර්මාන්තයේ සුරක්ෂිතතාව සඳහා වන ස්වේච්ඡා මග පෙන්වීම්


| | |
|---|---|
| ප්‍රකාශනය | : ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය |
| **ISBN** අංකය | : 978-955-8103-25-8 |
| ප්‍රථම මුද්‍රණය | : 2015 ජුනි |
| පරිවර්තනය හා සංස්කරණය | : හර්මන් කුමාර |
| සහය සංස්කරණය | : නාලක රොසයිරෝ |
| සෝදුපත් කියවීම | : රෝයි රොද්‍රිගෝ |
| තොරතුරු විමසීම් | : *hermankumara@gmail.com* |
| | : *nafsosl@gmail.com* |
| පරිඝණක පිටු සැකසුම | : ප්‍රදීප් ලක්සිරි ප්‍රනාන්දු |
| දුරකථනය | : + 94- 31 22 39750 |
| ෆැක්ස් | : + 94- 314 870658 |
| ලිපිනය | : අංක 10, මල්වත්ත පාර, මීගමුව. |
| වෙබ් පිටුව | : www.nafso-online.org |
| මුද්‍රණාලය | : අකුර මුද්‍රණාලය,<br>263, ශාන්ත ජෝශප් වීදිය, මීගමුව. |

# සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවයේ සුරක්ෂිතතාව සඳහා ජාත්‍යන්තර මාර්ගෝපදේශනයේ ක්‍රියාවලිය පිළිබඳ ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරයේ සංස්කරණ සටහන :

සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවය සුරක්ෂිත කිරීම නමින් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් (Food and Agriculture Organization of the United Nations -FAO) ගෝලීය මට්ටමේ ධීවර සමුළුවක් වසර 2008 ඔක්තෝබර් මස තායිලන්තයේ බැංකොක් නගරයේ දී කැඳවන ලදී. ලෝක ධීවර ජනතා සම්මේලනය හා ධීවර කාර්මිකයන්ගේ සහය සඳහා ජාත්‍යන්තර සාමූහිකය එක්ව සිවිල් සංවිධානවල ජාත්‍යන්තර සමුළුක් ද එහි දී සංවිධානය කරන ලදී. මෙම අවස්ථාව, මාර්ගොපදේශන ක්‍රියාවලියේ තීරණාත්මකව ආරම්භක අවධිය ලෙස දැක්විය හැකිය. සුළුපන්න ධීවර කර්මාන්තය පිළිබඳ තායිලන්තයේ පැවැත් වූ ගෝලීය සමුළුවේ දී ප්‍රමුඛ ක්ෂේත්‍රයන් තුනක් පිළිබදව සාකච්ඡා කරන ලදී.

තිරසරව සම්පත් භාවිතය ආරක්ෂා කිරීම සහ අයිතිවාසිකම්වලට ප්‍රවේශය රැක ගැනීම,
පසු අස්වනු ප්‍රතිලාභ ආරක්ෂා කිරීම,
සමාජ, ආර්ථික සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම,

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර කමිටුවේ (Committee on Fisheries - COFI) නිර්දේශය මත 2012 වසරේ පැවත් වූ එහි තිස්වැනි සැසිවාරයේ දී ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අධ්‍යක්ෂ ජොසේ ග්‍රාසියානෝ ද සිල්වා විසින් තිරසර සුළුපන්න ධීවර කර්මාන්තය සුරැකීම පිළිබඳ අන්තර්ජාතික මාර්ගෝපදේශනය පිළිබඳ තාක්ෂණික උපදේශනය කැඳවන ලදී. 2013 මැයි 20-24 දිනයන්හි දී ඉතාලියේ රෝම නගරයේ දී එම තාක්ෂණික උපදේශන සැසිය පැවැත්විණි. අනතුරුව එහි පුනර්ග්‍රහණ සැසිය 2014 පෙබරවාරි 3-7 දක්වා ඉතාලියේ රෝම නුවර FAO මූලස්ථානයේ දී පැවැත්විණි.

තාක්ෂණික උපදේශන සැසිය සඳහා FAO සාමාජිකයන් 98 දෙනෙක් සහභාගි වූ අතර අන්තර් රාජ්‍ය ආයතන 11ක්, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන හතරක් සහ සිවිල් සංවිධානවලින් නියෝජිතයන් 59 දෙනෙක් නිරීක්ෂකයන් ලෙස ද මෙම උපදේශන සැසියට සහභාගි වූහ මෙහි විස්තර www.fao.org/fishery/nems/40424/en. මගින් ලබාගත හැකිය. පාර්ශ්වකරුවන් 4000 කට අධික පිරිසක් සෘජු ලෙස සම්බන්ධ වූ පුළුල් සහභාගිත්ව උපදේශන ක්‍රියාදාමයක් මගින් එම මගපෙන්වීම්වල සංවර්ධනයන් පිළිබඳ දැනුම්වත් කිරීම සිදුකෙරිණ.

ලෝක ධීවර ජනතා සම්මේලනය හරහා රටවල් 22 ක සහභාගිත්වයෙන් සැකසුන සිවිල් සමාජ විශ්ලේෂණ ලියවිල්ලට ශ්‍රී ලංකාවේ දායකත්වය ලබාදීමට ජාතික මට්ටමින් වැඩ සටහන් 3 ක් සංවිධානය කිරීමට ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය මැදිහත්විය. මෙහි අන්තර්ගත කරුණු සුළුපන්න ධීවර කර්මාන්තයක් තුළින් ජීවිකාව ගෙනයන ධීවර ප්‍රජාවගේ අත්දැකීම් හා අවශ්‍යතාවන් නියෝජනය කරන බව එමගින් අවධාරණය කරමින් මෙම මාර්ගෝපදේශනයන් පොත් රාක්කවලට එක්වන තවත් පොතක් බවට පත් නොකර ක්‍රියාත්මක මට්ටමට ගෙන ඒම සඳහා උපරිම උත්සාහ කිරීම සුළුපන්න ධීවර ප්‍රජාව, ධීවර බලධාරීන් ඇතුළු සියලු දෙනාගේ ම වගකීමකි. අප විසින් සිදුකළ පරිවර්තනය තවත් දියුණු කිරීම හා සරල කිරීම මගින් ධීවර ප්‍රජාව අතර ප්‍රචලිත කිරීමට ධීවර සහයෝගිතා ව්‍යාපාරය ලෙස අපි ප්‍රතිඥා දෙමු. මේ සඳහා උනන්දුවන සියල්ලන් සමග අත්වැල් බැඳ ගැනීමට අපි සූදානම් අතර ඒ සඳහා ආරාධනා කරමු.

# තිරසර සුළුපන්න ධීවර කර්මාන්තය සුරැකීම සඳහා වන අන්තර්ජාතික මාර්ගෝපදේශනයන් සමාලෝචනය

මාර්ගෝපදේශන වැඩිදියුණු කිරීම සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මූලිකත්වය ගත යුතු යැයි ධීවර කමිටුව විසින් සියවිසි නව වැනි සැසිවාරයේදී මෙන්ම තිස්වැනි සැසි වාරයේ දී ද නිර්දේශ කර තිබිණි.

සුළුපන්න ධීවර කර්මාන්ත අංශයේ ආහාර සුරක්ෂිතතාව සහ දිළිඳු බව මුලිනුපුටා දැමීමේ වැදගත්කම සම්බන්ධයෙන් එම සැසිවාරයන්හිදීත් පුළුල් එකඟතාවක් තිබූ අතර මෙකී ගැටලුවලට ඔවුන්ගේ දායකත්වය අවශ්‍ය බව අවධාරණය කෙරිණි. මීට අමතරව, සාමාජික රාජ්‍යයන් ඉස්මතු කර දැක්වූයේ සුළුපන්න ධීවර කර්මාන්තයේ ගෝලීය අර්ථ විවරණයක් සඳහා එකඟවීමේ දුෂ්කරතාවක් තිබෙන බව ය. නමුත් එක් එක් රටවල සන්දර්භය තුළ එම මාර්ගෝපදේශනයන් යෙදිය යුතු බවට ද එකගතාවක් විය.

මෙම ලේඛනය සැකසීමේ දී 2010 සිට 2013 දක්වා පවත්වනු ලැබූ ගෝලීය උපදේශන ක්‍රියාදාමයක් මත පදනම්ව ඇත. කලාපීය වශයෙන් උපදේශන වැඩමුලු හයක් පැවැත්වූ අතර ඒවායේ වාර්තා සහ උපදේශන සභාව පිළිබඳ අතිරේක තොරතුරු ඒ සඳහා වෙන් වූ වෙබ් පිටුවක් වන www.fao.org/fishery/ssf/guidelines/en. හි ප්‍රසිද්ධ කර ඇත.

මෙම මාර්ගෝපදේශනයේ ස්වෙච්ඡාසහගතභාවය සලකා බලමින් එහි මාතෘකාව "ආහාර සුරක්ෂිතතාව හා දිළිඳුකම මුලිනුපුටා දැමීමේ සන්දර්භය තුළ සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසර බව සුරක්ෂිතකිරීම සඳහා වන ස්වෙච්ඡා මාර්ගෝපදේශයන්" විය යුතු බවට එකඟ වී ඇත.

2013 මැයි සැසිවාරය අවසානයේ තාක්ෂණික උපදේශන සභාව විසින් පූර්විකාව සහ කෙටුම්පත් කළ මාර්ගෝපදේශනයන්ගේ මතු දැක්වෙන පරිච්ඡේද සාකච්ඡා කර තිබිණි. 1. අරමුණු, 2. ස්වභාවය සහ විෂය පථය, 3. නියාමන මූලධර්ම, 4. වෙනත් අන්තර්ජාතික ලේඛන සමග තිබෙන සම්බන්ධතාව, 5. භුක්තිය පාලනය කිරීම සහ සම්පත් කළමනාකරණය, 6. සමාජ සංවර්ධනය, සේවා නියුක්තිය සහ යෝග්‍ය රැකියාව, 7. අගය දාමයන්, පසු අස්වනු සහ වෙළෙඳාම 7.9 ඡේදය වන තෙක් අවසන් කරන ලදී.

2014 පෙබරවාරි සැසියේදී 7 වන පරිච්ඡේදයේ ඉතිරි කොටස්වන අගය දාමයන්, පසු අස්වනු සහ වෙළෙඳාම සහිතව ඉතිරි පරිච්ඡේද සාකච්ඡා විය එනම් 8. ස්ත්‍රී පුරුෂ

සමානභාවය, 9. ව්‍යසන අවදානම සහ දේශගුණික වෙනස්කම්, 10. මූලධර්ම ගැලපීම, 11. තොරතුරු, පර්යේෂණ සහ සන්නිවේදනය, 12. හැකියා පරාස සංවර්ධනය සහ 13. සහයෝගය, අධීක්ෂණය සහ ඇගයීම ක්‍රියාවට නැංවීම යන අංශයන් පිළිබඳ එකගතාවන් ලබාගන්නා ලදී.

6.18 ඡේදය හැර මාර්ගෝපදේශනයන්ගේ සෙසු සියලු ඡේද සම්බන්ධයෙන් තාක්ෂණික උපදේශන සභාව එකඟතාවකට එළඹීමට සමත් විය. 6.18 ඡේදය (විකල්ප යෝජනාවක් සමග ඉදිරිපත් වූ) ධීවර කමිටුවට සලකා බැලීම සඳහා වරහන් තුළ සඳහන් කළ යුතුබවට සියල්ලන් එකඟවිය.

2008 බැංකොක් සම්මේලනයේ සහ 2010 වසරේ පැවති කලාපීය වැඩමුළු තුනක ප්‍රතිඵලවලින් දැනුම් දී තිබෙන පරිදි, අභ්‍යන්තර හා සාගර යන දෙයාකාරයේ ම සුළුපන්න ධීවර කර්මාන්තය ආමන්ත්‍රණය කරන අන්තර්ජාතික මාර්ගෝපදේශනයන් සංවර්ධනය කිරීමට ධීවර කමිටුවේ 29 වැනි සැසිවාරයේ දී එකඟ විය. එහි දී සංවර්ධනය වෙමින් පවතින රටවල අවශ්‍යතා සලකා බැලීමටත්, වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් සඳහා මාර්ගෝපදේශනයක් සැකසීමටත් එකඟ විය.

මේ මාර්ගෝපදේශනයන්ගේ ප්‍රමුඛතම අරමුණ වන්නේ සුළුපන්න ධීවර කර්මාන්තය ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය වෙත දක්වන දායකත්වය වැඩිදියුණු කිරීම සහ ආහාර සඳහා ඇති අයිතිය ප්‍රගතිගාමී ලෙස සාක්ෂාත් කර ගැනීම ට සහාය පළ කිරීමයි. මානව හිමිකම් පදනම් කර ගත් ප්‍රවේශයක් ප්‍රවර්ධනය කරමින්, ඒවායින් දිළිඳුකම මුලිනුපුටා දැමීමත්, සම සංවර්ධනයත් තිරසර ලෙස සම්පත් භාවිතයත් ඉටුකර ගැනීමට ප්‍රයත්න දරනු ඇත. මාර්ගෝපදේශනයන්ගෙන් මෙය ඉටුකර ගැනීමට උත්සාහ කරන්නේ සුළුපන්න ධීවර කර්මාන්තය බලගැන්වීමෙන්, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම තීරණ ගැනීමේ දී හවුල් කර ගැනීම, සිය අයිතිවාසිකම් භුක්ති විඳීම සහ ධීවර සම්පත්වල තිරසර භාවිතය සඳහා වගකීම් දැරීමට එමගින් ප්‍රයත්න දරනු ඇත.

වගකීම් සහගත ධීවර කර්මාන්තයක් සඳහා වූ සංග්‍රහයට අතිරේකව, ජාතික ආහාර සුරක්ෂිතතාවේ සන්දර්භය යටතේ ඉඩම්, ධීවර හා වනාන්තර භුක්තියේ පාලනය පිළිබඳ මාර්ගෝපදේශන සංග්‍රයට සහ ජාතික ආහාර ආරක්ෂාව පිළිබඳ සන්දර්භය තුළ ප්‍රමාණවත් පරිදි ආහාර ලැබීමේ අයිතිවාසිකම ඉටුකරගැනීම සඳහා ස්වෙච්ඡා මාර්ගෝපදේශනයන් ද මෙම තිරසර සුළුපන්න ධීවර කර්මාන්තයක් සඳහා මාර්ගෙ ‍ෝපදේශනයට ශක්තිය ලබාදේ.

# ආහාර සුරක්ෂිතතාව සහ දිළිඳුකම පිටුදැකීමේ සන්දර්භය තුළ සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවය සුරැකීම සඳහා වන ස්වෙච්ඡා මාර්ගෝපදේශනයන්

## අන්තර්ගතය


කෙටි යෙදුම් සහ සංකේත නාම XVI
පූර්විකාව XVII


### පළමු කොටස : හැඳින්වීම


1. අරමුණු 01
2. ස්වභාවය සහ විෂය පථය 02
3. නියාමන මූලධර්ම 03
4. සෙසු අන්තර්ජාතික ලේඛන සමග සම්බන්ධතාව 06


### දෙවන කොටස : වගකිවයුතු ධීවර කර්මාන්තය සහ තිරසර සංවර්ධනය


5. සුළුපන්න ධීවර කර්මාන්තයේ පාලනය සහ සම්පත් කළමනාකරණය 09
   5 අ) වගකිව යුතු ලෙස භුක්තියේ පාලනය 09
   5 ආ) තිරසර සම්පත් කළමනාකරණය 13
6. සමාජ සංවර්ධනය, සේවා නියුක්තිය සහ යෝග්‍ය රැකියාවක නිරතවීම 16
7. අගය දාම, පසු අස්වනු හා වෙළෙඳාම 21
8. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව 24
9. ආපදා අවදානම සහ දේශගුණික විපර්යාස 25


### තෙවන කොටස : මං සැලසෙන පරිසරයක් සාක්ෂාත් කිරීම සහ ක්‍රියාවට නැංවීමට සහාය වීම


10. ප්‍රතිපත්තිවල ගැළපීම, ආයතනික සම්බන්ධීකරණය සහ සහයෝගීතාව 31
11. තොරතුරු, පර්යේෂණ සහ සන්නිවේදනය 33
12. හැකියා සංවර්ධනය 36
13. ක්‍රියාවට නැංවීම සඳහා සහයෝගය සහ අධීක්ෂණය 37

# කෙටි යෙදුම් සහ සංකේත නාම

| | | |
|---|---|---|
| **CCA** | - | දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය |
| **CEDAW** | - | කාන්තාවන්ට එරෙහි සියලු ආකාරවල වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය |
| **COFI** | - | ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර කමිටුව |
| **CSO** | - | සිවිල් සමාජ සංවිධානය |
| **DRM** | - | ආපදා අවදානම කළමනාකරණය |
| **EAF** | - | ධීවර කර්මාන්තය සඳහා පරිසර පද්ධතිමය ප්‍රවේශය |
| **FAO** | - | ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| **HIV/AIDS** | - | මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය/ නතුකරගත් ප්‍රතිශක්ති ඌනතා සහලක්ෂණය |
| **ICESCR** | - | ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය |
| **IGO** | - | අන්තර් රාජ්‍ය සංවිධානය |
| **ILO** | - | ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| **IMO** | - | ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය |
| **IUU (fishing)** | - | නීතිවිරෝධී, වාර්තාගත නොවූ සහ නියාමනය නොකළ ධීවර කර්මාන්තය |
| **MCS** | - | අධීක්ෂණය, පාලනය සහ අන්වේෂණය |
| **NGO** | - | රාජ්‍ය නොවන සංවිධානය |
| **Rio+20** | - | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (රියෝ + 20) |
| **The Code** | - | වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් සඳහා ආචාර ධර්ම පද්ධතිය (**FAO**) |
| **UN** | - | එක්සත් ජාතීන් |
| **UN DRIP** | - | ස්වදේශීය ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය |
| **UNFCCC** | - | දේශගුණික වෙනස්කම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුව |
| **WTO** | - | ලෝක වෙළෙඳ සංවිධානය |

# පූර්විකාව

ආහාර සුරක්ෂිතතාව සහ දිළිඳුබව පිටුදැකීමේ සන්දර්භය තුළ තිරසර සුළුපන්න ධීවර කර්මාන්තය සුරැකීම සඳහා වන ස්වෙච්ඡාමය මාර්ගෝපදේශන මාලාව [VGSSF]1995 වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආචාර ධර්ම සංග්‍රහය [CCRF] සම්පූර්ණ කිරීමක් වශයෙන් එහි සමස්ත ප්‍රතිපත්ති සහ විධිවිධානවලට එකඟත්වය පළකරමින් සුළුපන්න ධීවර කර්මාන්තය සඳහා මගපෙන්වීම සම්පූර්ණ කිරීම සඳහා සකස් කරන ලදී. එයට අනුව මෙම මාර්ගෝපදේශයන්ගෙන් සුළුපන්න ධීවර කර්මාන්තයේ දෘෂ්‍යමානභාවය, පිළිගැනීම සහ එය වැඩිදියුණු කිරීමටත්, සාගින්න සහ දිළිඳුකම මුලිනුපුටා දැමීම සඳහා සිදුකෙරෙන ජාතික සහ ගෝලීය උත්සාහයන්ට දායකවීමත් අරමුණු කෙරේ. සුළුපන්න ධීවර කර්මාන්තය සහ ධීවර කම්කරුවන් සහ ඒ හා සබැඳි ක්‍රියාකාරකම් සහ අවදානමට ලක්වී සිටින හා කොන් කළ ජනතාව ද ඇතුළුව ඔවුන්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රවේශය අවධාරණය කරමින් මෙම මාර්ගෝපදේශනයන් මගින් වත්මන් හා අනාගත පරම්පරාවල ප්‍රතිලාභය උදෙසා වගකීම්සහගත ධීවර කර්මාන්තයට සහ තිරසර සමාජයීය හා ආර්ථික සංවර්ධනයට සහාය පළ කරයි.

මෙකී මාර්ගෝපදේශනයන් ස්වෙච්ඡාමය ඒවා බවත්, විෂය පථය අතින් ගෝලීය බවත්, සංවර්ධනය වන රටවල්වල අවශ්‍යතා වෙත කේන්ද්‍රීයකරණය වන බවත් අවධාරණය කෙරේ.

ස්ත්‍රීන් සහ පුරුෂයන් විසින් අගය දාමයේ සියලු ක්‍රියාකාරකම් එනම්, පූර්ව අස්වනු ක්‍රියාවලිය, අස්වැන්න නෙළීම සහ පසු අස්වනු ක්‍රියාවලිය යන සියල්ල ආවරණය කරමින් සුළුපන්න සහ ශිල්පීය ධීවර කර්මාන්තය ආහාර සුරක්ෂිතතාවේ සහ පෝෂණයේත්, දිළිඳු බව මුලිනුපුටා දැමීමේත්, සාධාරණ වර්ධනයේ සහ තිරසර සම්පත්[1] ප්‍රයෝජනයට ගැනීමේදීත් වැදගත් භූමිකාවක් ඉටුකරයි සුළුපන්න ධීවර කර්මාන්තය විසින් දේශීය, ජාතික සහ අන්තර්ජාතික වෙළෙඳපොළ වෙතට පෝෂණීය ආහාර සපයන අතර දේශීය සහ ජාතික ආර්ථිකයන් ට ශක්තිය සැපයීම පිණිස ආදායම් උපදවයි.

සුළුපන්න ධීවර කර්මාන්තය ගෝලීය මත්ස්‍ය අස්වනු නිපදවීමෙන් අඩකට දායක වෙයි. එයින් ඍජු මානව පරිභෝජනය සඳහා ගනු ලබන කොටස සලකන විට ඒ සඳහා මෙම උප අංශය විසින් දක්වන දායකත්වය තුනෙන් දෙක ද ඉක්මවයි. මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර ධීවර කර්මාන්තය විශේෂයෙන් වැදගත් වන අතර සුළුපන්න ධීවර කර්මාන්ත ආහාර නිෂ්පාදනය එම උප අංශයේ ප්‍රමුඛතම ස්ථානය ගනියි.

1. මෙම ලේඛනයේ 'ධීවර සම්පත්' යන යෙදුම මගින් අස්වනු නෙළීමට ලක්වන සියලු ජීවමාන ජලචර සම්පත් (මුහුදු පැළෑටි, කරදිය හා මිරිදිය කවච සහිත (බෙල්ලන් විශේෂ) මසුන් යනාදී) ආවරණය කෙරේ.

ලෝකයේ ධීවර කාර්මිකයින්ගෙන් සියයට 90 ක් සුළුපන්න ධීවර කර්මාන්තයේ නිරත වන්නන් වන අතර එයින් අර්ධයක් පමණ කාන්තාවන් වේ. පූර්ණ කාලීන-හෝ අර්ධ කාලීන ධීවරයන් හා ධීවර කම්කරුවන් ට අමතරව සෘතුමය හෝ කාලයෙන් කාලයට ධීවර කර්මාන්තයේ සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලෙන්නෝ මිලියන ගණනකගේ ජීවනෝපායට අගනා ඌනපූරණයක් ලබාදෙති මෙකී ක්‍රියාකාරකම් පුනරාවර්තී ලෙස සිදුවන අප්‍රධාන ක්‍රියාවන් හෝ අසීරු කාලවල දී අතිශය විශේෂ වැදගත්කමකින් යුත් ක්‍රියාවන් බවට පත්වීමට ඉඩ තිබේ. බොහෝ සුළුපන්න ධීවරයන් සහ ධීවර කම්කරුවන් ස්වයං රැකියාවන්හි නියුතු වූවන් වේ. එමෙන් ම සිය නිවෙස්වලට හෝ ප්‍රජාවන් වෙත සෘජු ලෙසම ආහාර සැපයීමේ යෙදීසිටින්නන් මෙන් ම වාණිජ ලෙස මසුන් ඇල්ලීමේ සකස් කිරීමේ සහ අලෙවිකරණයේ යෙදෙන්නන්ය. ධීවර කර්මාන්තය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් විසින් වෙරළබඩ, මෙන් ම ජලාශ ආශ්‍රිතව සහ ගංගා ආශ්‍රිත ප්‍රජාවන් දේශීය ආර්ථිකයට නිරතුරුව ම රුකුල් දීම සිදුකරන අතර සෙසු අංශවලට බහුගුණ බලපෑම් සිදුකරන බල යාන්ත්‍රයක් සංස්ථාපනය කරයි.

කාලීන සංක්‍රමණයන් මගින් නිරන්තරයෙන් සංකේතවත් කෙරෙන විවිධත්වයෙන් යුත් ගතිකමය උප අංශයක් ද සුළුපන්න ධීවර කර්මාන්තය විසින් නියෝජනය කරයි. මෙම උප අංශයේ ඉතා සියුම් ලක්ෂණ ස්ථානය අනුව වෙනස් වෙයි. සැබවින් ම සුළුපන්න ධීවර කර්මාන්තය දැඩි ලෙස ප්‍රාදේශීය ප්‍රජාවන් තුළ මුල්බැසගැනීම වෙත යොමුව තිබෙනුයේ තදාසන්න ධීවර සම්පත්, සම්ප්‍රදායයන් සහ අගයන්ගේ ඓතිහාසික බන්ධුතාවන් විදහා දක්වමින් සහ සමාජයීය ඒකාබද්ධතාවට සහාය දක්වමිනි. බොහෝ සුළුපන්න ධීවරයන් සහ ධීවර කම්කරුවෝ එකම ජීවන රටාවක් නියෝජනය කරන අතර එම උප අංශය මගින් ගෝලීය සුවිශේෂත්වයක් සහිත සංස්කෘතිකමය පොහොසත් බව හා විවිධත්වයක් මූර්තිමත් කරයි. බොහෝ සුළුපන්න ධීවරයන්, ධීවර කම්කරුවන් සහ ඔවුන්ගේ ධීවර ප්‍රජාව - අවදානමට ලක්වනසුලු සහ කොන් කළ කණ්ඩායම් ය. මොවුන්ද ඇතුළත් ව - සෘජුවම යැපෙන්නේ භූමිය සහ ධීවර සම්පත් මත ය. වෙරළබඩ/ජලතීර ප්‍රදේශවල ඉඩම් අයිතිවාසිකම්, ධීවර සම්පත වෙත ප්‍රවේශවීම සාක්ෂාත් කිරීම සඳහාත්, අතිරේක ක්‍රියාකාරකම් (මත්ස්‍ය සකස්කිරීම සහ අලෙවිය ඇතුළත්ව) සහ නිවාස සඳහාත් සෙසු ජීවනෝපාය සහාය සඳහාත් තීරණාත්මක ය. ජලජ පරිසර පද්ධතිවල සුවතාව සහ ඒ හා සබැඳි ජෛව විවිධත්වය ඔවුන්ගේ ජීවිකාවේ මූලික පදනමක් වන අතර සමස්ත යහ පැවැත්ම සඳහා දායක වීම පිණිස උප අංශයේ හැකියාව සම්බන්ධයෙන් ද මූලික පදනමක් වේ.

එම වැදගත්භාවය නොතකා, බොහෝ සුළුපන්න ධීවර ප්‍රජාවන් තවදුරටත් කොන්වී සිටින අතර ඔවුන්ට මෙන් ම සෙස්සන්ට ද ප්‍රතිලාභ ගෙනදෙන ආහාර සුරක්ෂිතතාව, පෝෂණය, දිළිඳුකම මුලිනුපුටා දැමීම, සාධාරණ සංවර්ධනය සහ තිරසර සම්පත් උපයෝජනය වෙත ඔවුන්ගේ දායකත්වය පූර්ණ වශයෙන් ලබාගෙන නැත.

සුළුපන්න ධීවර කර්මාන්තයේ දායකත්වය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම බොහෝ අභියෝග සහ බාධාවන් සහිත එකකි. ගතවූ දශක තුන හතරක කාලයේ දී බොහෝ අවස්ථාවන්හි දී ලොව පුරා සිදු වූ ධීවර කර්මාන්ත අංශයේ දියුණුව නමින් සිදුවුණේ සම්පත් අධික ලෙස සූරාකෑමට ලක්වීම සහ ජීවීන්ගේ ස්වාභාවික වාසභූමිවලට හා පරිසර පද්ධතිවලට තර්ජන මතුවීමත් ය. සුළුපන්න ධීවර කර්මාන්තයේ සම්පත් ප්‍රතිලාභ බෙදාගැනීමේදී හා සම්පත් වෙන්කිරීමේ දී පැවති පාරම්පරික ක්‍රියාමාර්ග හා චාරිත්‍රානුකූල පුරුදු අතහැරීමත්, සහභාගිත්ව ක්‍රමවේදයක් නොමැතිව සහ නිරන්තරයෙන් කේන්ද්‍රීයකරණය වූ ධීවර කර්මාන්ත කළමනාකරණ පද්ධති මෙන් ම වේගවත් තාක්ෂණික සංවර්ධනය සහ ජනගහන වෙනස්කම් හේතුවෙන් වෙනස් වී තිබේ. සුළුපන්න ධීවර ප්‍රජාවන් ද අසාධාරණ බල සබඳතාවලින් පොදු වශයෙන් පීඩා විඳිති, ස්ථාන ගණනාවක මහා පරිමාණ ධීවර මෙහෙයුම් සමග ගැටුම් පවතින අතර සුළුපන්න සහ සෙසු අංශ අතර තරගය හෝ එකිනෙකා මත අධික වශයෙන් රඳා පැවතීම වේගයෙන් ඉහළ යයි. මෙම සෙසු අංශ නිතරම ශක්තිමත් දේශපාලන හෝ ආර්ථික බලපෑම් සහිත ඒවා වීමට පුළුවන. තවද ඒවාට සංචාරක, ජලජීවී කර්මාන්තය, කෘෂිකර්මය, බලශක්තිය, කැණීම් කර්මාන්තය, කාර්මික ක්ෂේත්‍රය සහ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළත් වේ.

සුළුපන්න ධීවර ප්‍රජාවන් තුළ දිළිඳුකම බහුමාන ස්වභාවයකින් පවතී. එය අඩු ආදායම් නිසා පමණක් ඇති වන්නක් නොව සිවිල්, දේශපාලන, සමාජයීය, ආර්ථික හා සංස්කෘතික අයිතීන් පූර්ණ වශයෙන් භුක්ති විඳීමට ඉඩ අහිමිවීම හෝ වැළැක්වීම නිසා ද හටගන්නකි. සුළුපන්න ධීවර ප්‍රජාවන් සාමාන්‍යයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ස්ථානගත වී සිටිති. බොහෝ විට ඔවුන්ට ඇත්තේ වෙළෙඳපොළ වෙත සීමාසහිත හෝ අවාසිදායක ප්‍රවේශයකි. තවද බොහෝ අය සෞඛ්‍ය, අධ්‍යාපන සහ සෙසු සමාජ සේවාවන් වෙත අඩු ප්‍රවේශයක් ලබන්නෝ ද වෙති. විධිමත් අධ්‍යාපනයේ අඩු මට්ටම, දුර්වල සෞඛ්‍යයකින් යුතු වීම (HIV/AIDS ඉහළ මට්ටමකින් පැවතීම) සහ අප්‍රමාණවත් සංවිධානාත්මක ව්‍යුහයන් ඔවුන්ගේ සෙසු ලක්ෂණවලට ඇතුළත් වෙයි. සුළුපන්න ධීවර ප්‍රජාවන්ට විකල්ප ජීවනෝපායන්ගේ ඌනතාවකට, තරුණ විරැකියාව, අසතුටුදායක සහ අනාරක්ෂිත රැකියා පරිසර, බලයෙන් වැඩගැනීම සහ ළමා කම්කරු තත්වයන්ට ලක්වන බැවින් ඔවුන්ට තිබෙන අවස්ථා සීමිතවී ඇත. දූෂණය, පාරිසරික පිරිහීම, දේශගුණය වෙනස්වීමේ බලපෑම් සහ ස්වභාවික හා මිනිසා මුල්වීම නිසා හටගන්නා විපත් සුළුපන්න ධීවර ප්‍රජාවන් මුහුණ දෙන තර්ජනවලට එක් වේ. මේ සියලු සාධක විසින් සුළුපන්න ධීවරයන් හා ධීවර කම්කරුවන්ට සිය හඬ සෙස්සන්ට ඇසෙන්නට සැලැස්වීමටත්, සිය මානව හිමිකම් හා භුක්තික අයිතිවාසිකම් රැක ගැනීමටත් ඔවුන් රඳා පවතින ධීවර සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම ආරක්ෂා කිරීමටත් දුෂ්කර කරයි.

සුළුපන්න ධීවර ප්‍රජාවගේ නියෝජිතයන්, සිවිල් සමාජ සංවිධාන, රාජ්‍යයන්, කලාපීය සංවිධාන සහ සෙසු කොටස්කරුවන් සම්බන්ධ වූ සහභාගිත්ව හා උපදේශන ක්‍රියාවලියක් තුළින් මෙකී මාර්ගෝපදේශයන් [VGSSF]සංවර්ධනය කර තිබේ. ඉන්පසු ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තාක්ෂණික උපදේශන සභාවක් විසින් මෙකී මාර්ගෝපදේශනයන් සමාලෝචනයට ලක් කෙරිණි. සමානාත්මතාව සහ වෙනස් කොට නොසැලකීම, සහභාගිත්වය සහ අන්තර්ග්‍රහණය, වගවීම සහ නීතියේ ආධිපත්‍යය, සහ සියලු මානව හිමිකම් විශ්වීය, නොබෙදිය හැකි, එකනෙකට එකක් සම්බන්ධිත සහ අන්‍යෝන්‍ය ලෙස රඳාපවතින ඒවාය යන්න ඇතුළත් වූ පුළුල් පරිමාණයක වැදගත් මූලධර්ම සහ සලකා බැලීම් එහි දී ඔවුන් විසින් සිදුකරන ලදී. මෙම මාර්ගෝපදේශනයන් එකිනෙකට අනුරූපී හෙවත් සංගත වන අතර අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන් ඒවා මගින් ප්‍රවර්ධනය කරනු ලබයි. මෙකී මාර්ගෝපදේශනයන් උපචාර සංග්‍රහයට හා ඒ හා සබැඳි වෙනත් ලේඛනවලට ඌනපූරකයක් වේ. වගකිව යුතු ධීවර කර්මාන්තය සඳහා වන තාක්ෂණික මාර්ගෝපදේශන අංක 10 : ''දිළිඳු කම අඩු කිරීම සහ ආහාර සුරක්ෂිතතාව සඳහා සුළුපන්න ධීවර කර්මාන්තයේ දායකත්වය ඉහළ නැංවීම'' වැනි තාක්ෂණික මාර්ගෝපදේශනයන් සහ ජාතික ආහාර සුරක්ෂිතතාව (භුක්තියේ මාර්ගෝපදේශනයන්) යන සන්දර්භය තුළ ඉඩම් භුක්තිය, ධීවර කර්මාන්තය සහ වනාන්තර වගකීම්සහගත ලෙස පාලනය පිළිබඳ ස්වෙච්ඡාමය මාර්ගෝපදේශනයන් ද, [VGGT] ජාතික ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සන්දර්භය යටතේ ප්‍රමාණවත් පරිදි ආහාර ලැබීමේ අයිතිය (ආහාර සඳහා ඇති අයිතිය පිළිබඳ මාර්ගෝපදේශනය)[Right to Food] සුදුසු පරිදි සාක්ෂාත් කිරීම වැනි සෙසු අන්තර්ජාතික ස්වෙච්ඡා ලේඛන ද ඔවුන් විසින් සැලකිල්ලට ගනු ලැබිණි. රාජ්‍යයන් හා සෙසු පාර්ශ්වකරුවන් මෙම සෙසු මාර්ගෝපදේශනයන්ගේ මෙන් ම අදාළ අන්තර්ජාතික ලේඛන හා කලාපීය ලේඛන වල ද සහාය ලබාගැනීම සඳහා දිරිමත් කෙරෙන්නේ අදාළ බැඳීම්, ස්වෙච්ඡාමය කැපකිරීම් සහ ලබාගත හැකි මග පෙන්වීම්වල සහාය ලබාගැනීම සඳහා ය.

# පළමු කොටස :

# හැඳින්වීම

## 1. අරමුණු

1.1. මෙකී මාර්ගෝපදේශනයන්ගේ අරමුණු වනුයේ:

අ) සුළුපන්න ධීවර කර්මාන්තය ගෝලීය ආහාර සුරක්ෂිතතාවට සහ පෝෂණය වෙත දායක කරවීම සහ ප්‍රමාණවත් පරිදි ආහාර ලැබීමේ අයිතිය වෙත එය දායක කරවීම.

ආ) සුළුපන්න ධීවර ප්‍රජාවට යුක්තිසහගත සංවර්ධනයක් දායක කරවීමටත්, දිළිඳු බව මුලිනුපුටා දැමීම සහ තිරසර ධීවර කර්මාන්ත කළමනාකරණ සන්දර්භය යටතේ ධීවරයන්ගේ ද, ධීවර කම්කරුවන්ගේ ද සමාජ ආර්ථික මට්ටම වැඩිදියුණු කිරීම.

ඇ) වගකීමක් සහගත ධීවර කර්මාන්තය පිළිබඳ ආචාර ධර්ම සංග්‍රහය සහ ඒ ආශ්‍රිත ලේඛන සමග අනුරූපී වන සේ ධීවර සම්පත් සුරක්ෂණය සහ තිරසර හා දූරදර්ශී උපයෝජනය හා වගකීම්සහගත කළමනාකරණය සාක්ෂාත් කර ගැනීම.

ඈ) මිහිතලයේ සහ මිහිතලය මත වෙසෙන මිනිසුන්ගේ පාරිසරික ලෙස තිරසාර අනාගතයක් වෙනුවෙන් සුළුපන්න ධීවර කර්මාන්තය ආර්ථිකමය, සමාජයීය සහ පාරිසරික ලෙස දායක වීම ප්‍රවර්ධනය කිරීම.

ඉ) වගකීම්සහගත සහ තිරසර සුළුපන්න ධීවර කර්මාන්තයක් සඳහා එය පරිසර පද්ධතිවලට මිත්‍රශීලී ලෙස, රාජ්‍යයන්ට සහ කොටස්කරුවන්ට සලකා බැලිය හැකි සහභාගිත්ව ප්‍රතිපත්ති, ක්‍රමෝපායයන් සහ නීතිමය රාමුවක් තුළ සංවර්ධනය කිරීමට සහ ක්‍රියාවේ යෙදවීමට මගපෙන්වීම් සැපයීම.

ඊ) සුළුපන්න ධීවර ප්‍රජාවගේ පාරම්පරික සහ සම්ප්‍රදායික දැනුම, ඔවුන් හා සබැඳි සංරෝධනයන් හා අවස්ථා සැලකිල්ලට ගනිමින් ඔවුන්ගේ සංස්කෘතිය, භූමිකාව, දායකත්වය සහ ප්‍රබලත්වය පිළිබඳ මහජනයාගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම.

1.2 ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවය ම ඇතුළත්ව, සුළුපන්න ධීවර ප්‍රජාවන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා දායක කර ගැනීමටත්, ධීවර සම්පත්වල තිරසර භාවිතය පිළිබඳ සිය වගකීම් අනුමාන කිරීමටත් සුළුපන්න ධීවර ප්‍රජාවන් සවිබල ගැන්විය යුතු අතර සංවර්ධනය වෙමින් පවතින රටවල අවශ්‍යතාවන් අවධාරණය කරමින් සහ අවදානමට ලක්වූ හා කොන්වූ කණ්ඩායම්වලට ප්‍රතිලාභ ලැබෙන පරිදි මානව හිමිකම් පදනම් කරගත් ප්‍රවේශයකින් යුතුව මෙකී අරමුණු ළඟාකර ගත යුතු වේ.

## 2. ස්වභාවය සහ විෂය පථය

2.1 මෙම මාර්ගෝපදේශනයන් ස්වභාවයෙන් ස්වෙච්ඡාමය වේ. ඒවා සෑම සන්දර්භයක් තුළ දී ම සුළුපන්න ධීවර කර්මාන්තය වෙත යෙදිය යුතු අතර විෂය පථය අතින් ගෝලීය වන නමුත්, සංවර්ධනය වෙමින් පවතින රටවල අවශ්‍යතා කෙරෙහි විශේෂයෙන් ඉලක්ක කර ඇත.

2.2. මෙකී මාර්ගෝපදේශයන් සාගර සහ අභ්‍යන්තර ජලාශ යන දෙයාකාරයේ ම සුළුපන්න ධීවර කර්මාන්තයට අදාළ වේ. උදා:- අගය දාමයේ පුළුල් පරාසයේ ක්‍රියාකරකම් සහ පූර්ව අස්වනු සහ පසු අස්වනු ක්‍රියාකාරකම්වල යෙදෙන ස්ත්‍රීන් හා පුරුෂයන් සුළුපන්න ධීවර කර්මාන්තය සහ ජලජීවී කර්මාන්තය අතර පවතින වැදගත් සම්බන්ධතා පිළිගන්නා නමුත් මෙකී මාර්ගෝපදේශනයන් සෛද්ධාන්තික වශයෙන් කේන්ද්‍රීය වී තිබෙනුයේ මත්ස්‍ය අස්වනු නෙළීම සඳහා ය.

2.3 මෙකී මාර්ගෝපදේශයන් විසින් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සාමාජිකයන් හා සාමාජිකයන් නොවන්නන්, රාජ්‍යයේ සියලු මට්ටම් මෙන් ම, උපකලාපීය, කලාපීය, අන්තර්ජාතික සහ අන්තර් රාජ්‍ය සංවිධාන ද, සුළුපන්න ධීවර කර්මාන්තයේ නියැළී සිටින්නන් (ධීවරයන්, ධීවර කම්කරුවන්, ඔවුන්ගේ ප්‍රජාවන්, සම්ප්‍රදායික සහ පාරම්පරික බලධාරීන්ද, අදාල වෘත්තීය සංවිධානද සිවිල් සංවිධානද ඇතුළත්ව)ද ආමන්ත්‍රණය කෙරේ තවද ඒවායින් පර්යේෂණ සහ අධ්‍යයන ආයතන, පුද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ සෙසු සියලු ධීවර, වෙරළ සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ සැලකිල්ල යොමුකරන්නන් හා ජලජ පාරිසරික සම්පත් පරිහරණය කරන්නන් ද ඉලක්ක කෙරේ.

2.4 සුළුපන්න ධීවර කර්මාන්තයට දැවැන්ත විවිධත්වයක් තිබෙන බවත්, සුළුපන්න ධීවර උප අංශය පිළිබඳ එක් තනි එකඟ වූ අර්ථ විවරණයක් නොමැති බවටත් මාර්ගෝපදේශනවලින් පිළිගනියි. මෙයට අනුව, මාර්ගෝපදේශයන්ගෙන් සුළුපන්න ධීවර කර්මාන්තය පිළිබඳ ව ප්‍රමිතිගත අර්ථ විවරණයක් හෝ ජාතික සන්දර්භයක් තුළ ආදේශ කළ යුතු අන්දම නියම නොකරෙයි. සුළුපන්න ධීවර කර්මාන්තයට සහ අවදානමට ලක්වන සුලු ධීවර ප්‍රජාවට විශේෂ අදාළතාවකින් යුතුව මෙකී මාර්ගෝපදේශනයන් විශේෂයෙන් අදාළ වේ. මාර්ගෝපදේශනයන් යෙදීම පිළිබඳ විනිවිදභාවය සහ වගවීම සුරැකීම පිණිස කුමන ක්‍රියාකාරකම් හා ක්‍රියාකරන්නන් සුළුපන්න ලෙස සැලකිය යුතු ද යන්න අවබෝධ කර ගත යුතු වන අතර දැවැන්ත අවධානයක් අවශ්‍ය කර තිබෙන කොන් වූ ජනතාව හඳුනාගත යුතු ය. මෙය කලාපීය, උප කලාපීය හෝ ජාතික මට්ටමෙන් සහ ඒවා යෙදිය යුතු වන විශේෂිත සන්දර්භයට අනුව සිදුකළ යුතුය. එම හඳුනාගැනීම

සහ යෙදීම අර්ථ සම්පන්න සහ ස්වාධීන සහභාගිත්වයකින්, උපදේශනාත්මක ලෙස, බහුවිධ මට්ටම්වල දී හා වාස්තවික මූලිකත්වයෙන් යුතුව කාන්තාවන් හා පුරුෂයන් යන දෙපිරිසේම හඬ ඇසෙන පරිදි සිදුකරන බවට රාජ්‍යයන් සහතික විය යුතුය. එවැනි ක්‍රියාවලියක දී සුදුසු සහ අදාළ පරිදි සියලු පාර්ශවයන් සහභාගි විය යුතු හා සහාය දැක්විය යුතු වේ.

2.5 මෙකී මාර්ගෝපදේශනයන් ජාතික නෛතික පද්ධති සමග සහ ආයතන සමග අර්ථ දැක්වීම හා යෙදීම කළ යුතු වේ.

## 3. නියාමන මූලධර්ම

3.1 අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන්, වගකීමක් සහිත ධීවර කර්මාන්තය පිළිබඳ ප්‍රමිතීන් සහ පරිචයන් සහ තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (රියෝ +20) හි අවසන් ප්‍රතිඵලය වන 'අපට අවශ්‍ය අනාගතය' ["The Future We Want"] ලේඛනය, ආචාර ධර්ම සංග්‍රහය සහ සෙසු අදාළ ලේඛනවලට අනුකූල තිරසර සංවර්ධනය මත මෙම මාර්ගෝපදේශනයන් පදනම් වී ඇති අතර අවදානමට ලක්විය හැකි සහ කොන්වූ පුද්ගල කණ්ඩායම් කෙරෙහි ද ප්‍රමාණවත් පරිදි ආහාර ලබාගැනීමේ අයිතිය [Right to adequate Food] ප්‍රගතිශීලී ලෙස සාක්ෂාත් කර ගැනීම කෙරෙහි සහයෝගය ලබාදීමේ අවශ්‍යතාව වෙත විශේෂ අවධානය යොමුකරමින් සකස් කර ඇත.

1. **මානව අයිතිවාසිකම් සහ අභිමානය** : සියලු පුද්ගලයන්ගේ නෛසර්ගික අභිමානය සහ සමාන හා අන්සතු කළ නොහැකි මානව හිමිකම් පිළිගනිමින්, සියලු පුද්ගලයන් විසින් මානව හිමිකම් මූලධර්මයන් පිළිගැනීම, ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම කළ යුතු වන අතර අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන්ගෙන් නියම කර තිබෙන පරිදි: විශ්වීය බව සහ අන්සතු කළ නොහැකි බව, නොබෙදිය හැකි බව, අන්තර් රඳාපැවතීම සහ අන්තර්සම්බන්ධ බව, වෙනස්කොට නොසලකන බව සහ සමානාත්මතාව, සහභාගිත්වය සහ අන්තර්ග්‍රහණය, වගවීම හා නීතියේ ආධිපත්‍යය විසින් නියම කරන පරිදි සුළුපන්න ධීවර කර්මාන්තයෙන් යැපෙන ප්‍රජාවන් සඳහා ඒවා යෙදිය යුතු ය. සුළුපන්න ධීවර කර්මාන්තය තුළ ක්‍රියාකාරීවන මානව හිමිකම් ක්‍රියාධරයන්ගේ අයිතිවාසිකම්වලට රාජ්‍යයන් විසින් ගරු කළ යුතු වන අතර ඒවා ආරක්ෂා කළ යුතු ද වේ.

ව්‍යාපාර ව්‍යවසායන් ඇතුළු සුළුපන්න ධීවර කර්මාන්තයට සම්බන්ධ සහ එයට බලපෑම් කරන සියලු රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් ට මානව හිමිකම් සුරක්ෂණය සඳහා වගකීමක් තිබේ රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයන්ගේ සුළුපන්න ධීවර කර්මාන්තය තුළ සිදුකරන ක්‍රියාකාරකම්වල විෂය පථය, ඒවා අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන් ට අනුගත බව සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍යයන් විසින් නියාමනය කළ යුතු ය.

2. **සංස්කෘතීන්ට ගරු කිරීම :** කාන්තා නායකත්වය දිරිගන්වමින් සහ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරවල වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය [CEDAW] හි 5 වන වගන්තිය සැලකිල්ලට ගනිමින් ආදිවාසී ජනතාව සහ වාර්ගික සුළුතරය ඇතුළත් ව සුළුපන්න ධීවර ප්‍රජාවන්ගේ සම්ප්‍රදායික සහ දේශීය දැනුම හා පරිචයන් සහ සංවිධානය වීමේ දැනට පවත්නා ආකාරවලට ගරු කිරීම සහ ඒවා පිළිගැනීම.

3. **වෙනස්කොට නොසැලකීම :** සුළුපන්න ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ දී ප්‍රතිපත්තිවල සහ භාවිතයන්හි තිබෙනා සියලු ආකාරවල වෙනස්කොට සැලකීම් පිටුදැකීම.

4. **ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව සහ සාධාරණත්වය:** ස්ත්‍රීපුරුෂ සමානතාව, සාධාරණය ඕනෑම සංවර්ධනයක් සඳහා මූලික වේ. සුළුපන්න ධීවර කර්මාන්තයේ දී කාන්තාවන්ගේ භූමිකාවේ ඇති ජවයේ වටිනාකම පිළිගනිමින් සමාන අයිතිවාසිකම් සහ අවස්ථාවන් ප්‍රවර්ධනය කළ යුතු ය.

5. **සාධාරණත්වය සහ සමානාත්මතාව :** සියලු ම ජනතාවට නීතිමය සහ භාවිතාමය වශයෙන් සාධාරණ ලෙස සැලකීම සහ යුක්තිය ප්‍රවර්ධනය කිරීම. සියලු මානව හිමිකම් භුක්ති විඳීමට තිබෙන සමඅයිතිවාසිකම් ද මෙයට ඇතුළත් වේ. මේ අතර, ස්ත්‍රීන් හා පුරුෂයන් අතර පවතින වෙනස්කම් පිළිගත යුතු අතර මෙකී තත්වාකාර (de facto) සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂිත පියවර ගත යුතු වේ. උදා:- විශේෂයෙන් ම අවදානමට ලක්විය හැකි සහ කොන් වූ කණ්ඩායම් සමාන ප්‍රතිඵල ලබාගැනීමට සහය ඉල්ලා සිටින විට ඔවුන් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් ලබාදීම.

6. **උපදේශනය සහ සහභාගිත්වය:** ආදිවාසී ජනතාව ඇතුළුව සුළුපන්න ධීවර ප්‍රජාවන් හට ක්‍රියාකාරී, නිදහස්, බලාත්මක, අර්ථ සම්පන්න සහ දැනුම්වත් කළ සහභාගිත්වයක් සහතික කිරීම පිණිස ධීවර සම්පත්වලට සම්බන්ධිත සහ සුළුපන්න ධීවරයන් කර්මාන්තය ක්‍රියාත්මක වන ප්‍රදේශ මෙන් ම ඒ හා සබැඳි ගොඩබිම් ප්‍රදේශ ද ඇතුළත්ව සකල තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ම ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය

[UNDRIP] සැලකිල්ලට ගත යුතු වන අතර, වෙනත් පාර්ශවයන් අතර පවත්නා බල අසමතුලිතතාවන් ද සැලකිල්ලට ගත යුතුය. තීරණ ගැනීමට පෙර එම තීරණවලින් බලපෑමට ලක්විය හැකි පුද්ගලයන්ගේ ප්‍රතිචාර හා සහයෝගය මෙන් ම ඔවුන්ගේ දායකත්වයට දක්වන ප්‍රතිචාරය ද මෙයට ඇතුළත් විය යුතු ය.

7. **නීතියේ ආධිපත්‍යය:** භාවිතයේ පවතින භාෂාවන්ගෙන් පුළුල් ලෙස ප්‍රසිද්ධියට පත්කර ඇති: සියලු දෙනාට පොදු වූ: එකලෙස බල ගන්වනු ලැබූ හා ස්වාධීනව තීරණය කරනු ලැබූ: දැනට පවතින ජාතික හා ජාත්‍යන්තර බැඳීම් සහිත නීතීන් වලට එකඟ වන: උචිත කලාපීය හා ජාත්‍යන්තර මෙවලම් යටතේ ඇති ස්වේච්ඡා බැඳීම් පිළිබඳ මනා සැලකිල්ලෙන් යුක්තව: සුළු පන්න ධීවර කර්මාන්තය සඳහා නීති පදනම් කරගත් එලැඹුමක් ගොඩනැගීම

8. **විනිවිදභාවය:** ප්‍රතිපත්තීන්, ක්‍රියා පටිපාටීන් හා නීතිරීතීන්, ඔබින භාෂාවන්ගෙ න් පැහැදිළිව අර්ථගැන්වීම හා පුළුල් ලෙස ප්‍රසිද්ධියට පත්කිරීම, තීරණ සියලු දෙනාටම භාවිතයට ගත හැකි ආකෘතියකින් සහ ඔබින භාෂාවන්ගෙන් පුළුල්ව ප්‍රචාරයට ලක්කිරීම.

9. **වගවීම:** තනි පුද්ගලයන්, මහජන නියෝජිතායතන සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයන් තමන්ගේ ක්‍රියාවන් කෙරෙහි වගකිව යුතුවීම සහ නීතියේ ආධිපත්‍යයට අනුකූල ව තීරණ ගැනීම.

10. **ආර්ථික, සමාජීය හා පාරිසරික තිරසරභාවය:** ධීවර සම්පත් පමණ ඉක්මවා සූරාකෑම සහ අහිතකර පාරිසරික, සමාජීය හා ආර්ථික බලපෑම් ඇතුළත්ව නුසුදුසු ප්‍රතිඵලවලට එරෙහිව ආපදා කළමනාකරණය හා ආරක්ෂක එළඹුමක් භාවිතා කිරීම

11. **සාකල්‍ය සහ සමෝධානිත ප්‍රවේශයන්:** ධීවර කර්මාන්තය සඳහා පාරිසරික ප්‍රවේශය (Environmental Approach on Fisheries) වැදගත් මගපෙන්වුම් මූලධර්මයක් ලෙස පිළිගනිමින්, පරිසර පද්ධතිවල සියලු කොටස්වල තිරසරභාවය මෙන් ම සුළුපන්න ධීවර ප්‍රජාවන්ගේ ජීවිකාවන් ගේ පුළුල්භාවය පිළිගැනීම සහ සුළුපන්න ධීවර කර්මාන්තය සෙසු බොහෝ අංශ සමග සම්බන්ධ වී ඇති හෙයින් සහ අන්තර් යැපීමක් ඇති හෙයින් එම අංශ එකිනෙක අතර සම්බන්ධීකරණය සාක්ෂාත් කිරීම.

12. **සමාජ වගකීම:** ප්‍රජා සමගිය ප්‍රවර්ධනය කිරීම සහ සාමූහික හා ඒකාබද්ධ වගකීම ප්‍රවර්ධනය කිරීම. හවුල්කරුවන් අතර සහයෝගය ප්‍රවර්ධනය කරන පරිසරයක් පවත්වාගෙන යාම.

13. **ශක්‍යතාව සහ සමාජ, ආර්ථික ස්වශක්තතාව:** ප්‍රතිපත්ති, ක්‍රමෝපායයන්, සැලසුම් සහ ක්‍රියාවන් මගින් සුළුපන්න ධීවර කර්මාන්තය පාලනය කිරීම සාක්ෂාත් කරන බව සහ සංවර්ධනය සමාජයීය හා තාර්කික බව ඒවා දැනට පවත්නා තත්වයන් තුළ, ක්‍රියාවට නැංවිය හැකි විය යුතු අතර ආශ්‍රිත කරුණුවලට අනුව වෙනස්කම්වලට ලක්කිරීමට හැකි විය යුතුය. තවද ඒවා ප්‍රජා ප්‍රත්‍යස්ථිතිය (පහසුවෙන් ප්‍රකෘති තත්වයට පත්වීම සඳහා) සඳහා උපකාර කළ යුතුය.

## 4. සෙසු අන්තර්ජාතික ලේඛන සමග සම්බන්ධතාව

4.1 ජාතික සහ අන්තර්ජාතික නීතිය යටතේ දැනට තිබෙන බැඳීම් සමග අනුගත වන සේ සහ කලාපීය හා අන්තර්ජාතික ලේඛන යටතේ සිදුකළ විධානයන් සමග අනුකූල වන පරිදි මේ මාර්ගෝපදේශයන් අර්ථ දැක්විය යුතුය. මේවා මානව හිමිකම්, වගකීමක් සහිත ධීවර කර්මාන්තය සහ තිරසර සංවර්ධනය ආමන්ත්‍රණය කර සිටින අන්තර්ජාතික හා කලාපීය මුලපිරීම්වල සහාය දක්වන ඌනපූරකයන් වේ. ආචාර ධර්ම සංග්‍රහයට ඌනපූරකයක් ලෙස මෙම මාර්ගෝපදේශයන් සංවර්ධනය කර තිබෙන අතර, වගකිවයුතු ධීවර කර්මාන්තයකට හා මේ ලේඛනය අනුව තිරසර සම්පත් උපයෝගීතාවට මෙයින් සහයෝගය පළ කරයි.

4.2 මේ මාර්ගෝපදේශනයන්ගේ ඇති කිසිම කරුණක් රාජ්‍යයක් මගින් අන්තර්ජාතික නීතිය යටතේ විෂය විය හැකි කිසිදු අයිතිවාසිකමක් හෝ බැඳීමක් සීමාකරන ලෙස හෝ ඒවාට පීඩාවක් වන ලෙස සිදුනොකළ යුතුය. සංශෝධනයන් සිදුකිරීමේ දී ඒවාට මගපෙන්වීමට සහ නව හෝ අතිරේක නීති සහ නියාමන විධිවිධාන සම්පාදනය සඳහා පෙළඹවීමක් ලෙස මෙම මාර්ගෝපදේශනයන් භාවිතා කළ හැකි වේ.

## දෙවන කොටස:

# වගකීමක් සහිත ධීවර කර්මාන්තය හා තිරසර සංවර්ධනය.

## 5. සුළුපන්න ධීවර කර්මාන්තය ආශ්‍රිත භුක්තියේ පාලනය හා සම්පත් කළමනාකරණය

5.1 වර්තමාන සහ අනාගත පරම්පරාවන්ගේ සංවර්ධන සහ පාරිසරික අවශ්‍යතා ඉටුකිරීම සඳහා ජලජීවී ජෛව විවිධත්වය සහ ස්වාභාවික සම්පත් වගකිවයුතු සහ තිරසර ආකාරයට භාවිතා කිරීමේ අවශ්‍යතාව මෙම මාර්ගෝපදේශ මගින් පිළිගෙන තිබේ. සුළු පරිමාන ධීවර ප්‍රජාවන්ට තම සමාජීය හා සංස්කෘතික මෙන්ම ජීවිකා වෘත්තීන්ගේ හා තිරසර සංවර්ධනයේ පදනම සකස් කර දෙන සම්පත් සඳහා ආරක්ෂිත භුක්තියේ අයිතියක් තිබීම අවශ්‍ය වේ[2]. ධීවර කර්මාන්තය සහ පරිසර පද්ධතීන් වගකිවයුතු ලෙස කළමනාකරණය කිරීම මගින් ලබා ගන්නා ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදාදීම,. සුළු පරිමාන ධීවරයින්ට හා ධීවර කම්කරුවන් වන කාන්තා පිරිමි දෙපක්ෂයට ම ප්‍රදානයන් ලබාදීම වෙත විශේෂ අවධානය යොමු කිරීම මෙම මාර්ගෝපදේශ මගින් දිරිමත් කරයි.

## 5 (අ). වගකිව යුතු ලෙස භුක්තිය පාලනය

5.2 මානව හිමිකම්, ආහාර සුරක්ෂිතතාව, දිළිඳුකම පිටුදැකීම, තිරසර ජීවනෝපායයන්, සමාජ ස්ථාවරත්වය, නිවාස සුරක්ෂිතතාව, ග්‍රාමීය සංවර්ධනය සහ සමාජ සහ ආර්ථික වර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා ධීවර ක්ෂේත්‍රයට අදාළ වන ඉඩම් සහ වනාන්තර භුක්තිය වගකිව යුතු ලෙස පාලනය කිරීම සඳහා කේන්ද්‍රීය අවධානය යොමුවිය යුතු බව සියලු ම පාර්ශ්වයයන් අවබෝධ කර ගත යුතුය[3].

5.3 පවතින නීතියට අනුකූලව, සුළු පරිමාණ ධීවරයින්ට, එම ධීවර ක්ෂේත්‍රයේ නියුතු සේවකයින්ට සහ ඔවුන්ගේ ප්‍රජාවන්ට ධීවර සම්පත්වලට (මුහුදු සහ අභ්‍යන්තර ජලාශ) හා කාන්තාවන්ගේ භුක්ති අයිතිවාසිකම් කෙරෙහි විශේෂ අවධානය

2. 'භුක්තියේ අයිතිවාසිකම්' යන යෙදුම භුක්ති මාර්ගෝපදේශවල අන්තර්ගතයට අනුකූලව යොදා ඇති බැවින් භුක්තිය යන යෙදුමෙහි අදහස මගින් කවර ස්වාභාවික සම්පතක් කවර අයෙකුට, කවර කාලයකට සහ කවර කොන්දේසි යටතේ භාවිත කළ හැකි ද, නිශ්චය කරයි. එබැවින්, 'ප්‍රවේශ අයිතිය', 'පරිහරණ අයිතිය' සහ 'කළමනාකරණ අයිතිය' යන අනෙකුත් සුලභව භාවිත වන යෙදුම් ද එමගින් ආවරණය කෙරෙයි.

3. භුක්තියේ මාර්ගෝපදේශවල 4.1 වැනි වගන්තිය පදනම් කර ගෙන

යොමු කරමින්, සුළු පරිමාණ ධීවර කර්මාන්තය සිදුකරන ප්‍රදේශ වලට සහ යාබද භූමි වලට, ආරක්ෂිත, සාධාරණ, සමාජමය සහ සංස්කෘතිකමය ලෙස ඔබින භුක්ති අයිතිවාසිකම්, ලැබෙන බවට රාජ්‍යයන් (States) විසින් සහතික වියයුතු වේ.

5.4 සියලුම පාර්ශ්වයන්, ඔවුන්ගේ ව්‍යවස්ථාපිත නීති අනුව, ඔබින අවස්ථාවන් හිදී පාරම්පරික අයිතීන් ද සැලකිල්ලට ගනිමින් සුළු පරිමාණ ධීවර ප්‍රජාවන් භුක්තිවිඳින ලද ඉඩම්, ජලජ සම්පත් හා ධීවර බිම් වල යුක්තිසහගත අයිතීන් පිළිගෙන ඒයට ගරු කළ යුතු අතර භුක්ති අයිතිවාසිකම් ආරක්ෂා කළයුතු වේ. විවිධ ආකාරයේ යුක්තිසහගත භුක්තියේ අයිතීන් සුරක්ෂිත කිරීමට අවශ්‍ය විට දී ඊට අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයි. යුක්ති සහගත භුක්තියේ අයිතිය දරන්නන් හා ඔවුන්ගේ අයිතිවාසිකම් හඳුනාගැනීමට, වාර්තා කර ගැනීමට සහ ඒවාට ගරුකිරීමට රාජ්‍යයන් නිසි පියවර ගතයුතුය.

විධිමත් පරිදි වාර්තාකර තිබුණ ද එසේ නැතිවුව ද[4], යුක්ති සහගත භුක්තියේ අයිතිය දරන්නන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හඳුනාගැනීමට, වාර්තා කරගැනීමට සහ ඒවාට ගරු කිරීමට රාජ්‍යයන් විසින් නිසි පියවර ගත යුතු වේ. ජනවාර්ගික සුළුතරය හා ස්වදේශික ජන කොට්ඨාස ද ඇතුළත්ව, සුළු පරිමාණ ධීවර ප්‍රජාවන් සතු ප්‍රාදේශීය ජීවන රටාව හා සිරිත් මෙන් ම ධීවර සම්පත් සහ ඉඩම්වලට ඇති පාරම්පරික, එසේ නැතහොත් මනාප ප්‍රවේශය පිළිගෙන, ඒවාට ගරු කර, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට සහ ස්වදේශික ජන කොටස්වලත් අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනයට අනුකූල වන ආකාරයකට ඒවා ආරක්ෂා කළ යුතු වේ. මෙම කාරණයේ දී එක්සත් ජාතීන්ගේ ස්වදේශික ජනකොට්ඨාශයන් හී අයිතීන් පිළිබඳ ප්‍රකාශනය හා ජාතික හෝ ජන වාර්ගික, ආගමික හා භාෂාමය සුළුතරයන්ට අදාල පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයන් සැලකිල්ලට ගත යුතු වේ. ව්‍යවස්ථාමය හෝ නීතිමය ප්‍රතිසංස්කරණ මගින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කර ඔවුන්ගේ චාරිත්‍ර සමග ගැටුම්කාරී තත්ත්වයන් වල දී, එවැනි වෙනස්කම් පාරම්පරික බුක්ති ක්‍රමයට ගැළපෙන ආකාරයට යොදාගැනීමට සියලුම පාර්ශ්වයන් සහයෝගය ලබා දිය යුතු වේ[5].

5.5 ධීවර ප්‍රජාවන්ට හා ස්වදේශීය ජනයාට, ප්‍රාදේශීය, ජලජ හා වෙරළබඩ පරිසර පද්ධතීන් ප්‍රතිස්ථාපනය කිරීමට, සංරක්ෂණයට, ආරක්ෂා කිරීමට හා සහකළමනාකරණයට ඇති අයිතිය රාජ්‍යයන් පිළිගත යුතුයි.

4. ඉඩම් භුක්ති මාර්ගෝපදේශවල 3.1 වැනි වගන්තිය පදනම් කර ගෙන

5. ඉඩම් භුක්ති මාර්ගෝපදේශවල 9.6 වැනි වගන්තියෙන් උපුටා ගත් කොටස

5.6 ජලය (ධීවර සම්පත් ද ඇතුළුව) සහ ඉඩම් සම්පත් රජය සතුව තිබෙන හෝ රජය විසින් පාලනය කරනු ලබන අවස්ථාවල, පුළුල් සමාජ, ආර්ථික සහ පාරිසරික අරමුණු අනුව එම සම්පත්වල භාවිතය සහ භුක්ති අයිතීන් ඔවුන් විසින් තීරණය කළ යුතුවේ[6]. විශේෂයෙන් සුළු පරිමාණ ධීවර ප්‍රජාවන් විසින් සාමූහික ලෙස පරිහරණය කරනු ලබන සහ කළමනාකරණය කරනු ලබන මහජනතාව සතු සම්පත් රාජ්‍යයන් විසින් නිසි පරිදි පිළිගැනීම සහ ආරක්ෂා කිරීම සිදු කළ යුතු වේ.

5.7 විශේෂයෙන් ම ආපදා වලට ලක්විය හැකි හෝ අවාසිදායක තත්වයන්හි සිටින ජන කණ්ඩායම් ඇතුළුව, විවිධ ජන කණ්ඩායම් සඳහා සාධාරණ ප්‍රතිඵල සාක්ෂාත් කර දීමේ අදහසින් වගකිවයුතු ධීවර කර්මාන්තයක් සඳහා වන ආචාර ධර්ම පද්ධතියේ 6.18 වගන්තිය නිසි සැලකිල්ලට ගනිමින් රාජ්‍යයන් විසින් ජාතික අණසක යටතේ පවතින, සුදුසු ජල ප්‍රදේශවල ධීවර කර්මාන්තය සඳහා සුළු පන්න ධීවරයින් හට මනාප ප්‍රවේශයට ඉඩදිය යුතුය. වෙනත් කරුණු අතර, සුළු පරිමාණ ධීවර කර්මාන්තය සඳහා ම පමණක් වෙන් වූ කලාප නිර්මාණය කිරීම සහ බලාත්මක කිරීම වැනි විශේෂිත ක්‍රියාමාර්ග සළකා බැලිය යුතු වේ. තුන්වන රටවල් සහ තුන්වන පාර්ශව සමග සම්පත් සඳහා ප්‍රවේශය පිළිබඳ ගිවිසුම්වලට එළඹීමට පෙර සුළු පරිමාණ ධීවර ප්‍රජාවන් සම්බන්ධයෙන් නිසි සලකා බැලීමක් කළයුතු වේ.

5.8 ජාතික ආහාර සුරක්ෂිතතාව යන කාරණයේදී ඉඩම්, ධීවර සහ වනාන්තර භුක්තිය වගකිවයුතු ලෙස පාලනය පිළිබඳ ස්වේච්ඡා මාර්ගෝපදේශවල විධිවිධානයන්ට අනුව, නැවත බෙදාදීමේ ප්‍රතිසංස්කරණ කෙරෙහි සුදුසු ලෙස අවධානය යොමුකරමින් ජාතික නීතින් හට එකඟව සුළු පරිමාණ ධීවර ප්‍රජාවන් සඳහා ධීවර සම්පත් සහ ඉඩම්වලට සාධාරණ ප්‍රවේශයක් ලබාදීමට රාජ්‍යයන් පහසුකම් සැලසිය යුතුය.

5.9 සුළු පරිමාණ ධීවර ප්‍රජාවන් අත්තනෝමතික ලෙස පිටමං නොකරන බවට සහ ඔවුන්ගේ යුක්තිසහගත භුක්ති අයිතිවාසිකම් නීත්‍යානුකූල නොවන වෙනත් අකාරයකින් අහෝසිකර හෝ උල්ලංඝනය නොකරන බවට රාජ්‍යයන් විසින් සහතික විය යුතු වේ[7]. සම්පත් පරිහරණය කරන අනෙකුත් අංශවලින් එල්ලවන

6. ඉඩම් භුක්ති මාර්ගෝපදේශවල 8.1 වැනි වගන්තිය පදනම් කර ගෙන

7. භුක්ති මාර්ගෝපදේශවල 4.5 වැනි වගන්තිය පදනම් කර ගෙන

තරගය වැඩිවෙමින් පවත්නා බවත්, සුළු පරිමාණ ධීවර ප්‍රජාවන්, විශේෂයෙන් ම ආපදාවන්ට ගොදුරුවන සහ ආන්තික කණ්ඩායමක් මෙන් ම, අනෙකුත් අංශ සමග ඇතිවන ගැටුම්වල දී නිතරම දුර්වල පක්ෂය වන හෙයින් ද, අනෙකුත් අංශවල සංවර්ධනයන් සහ ක්‍රියාකාරකම් මගින් ඔවුන්ගේ ජීවනෝපායන්ට තර්ජන එල්ලවුවහොත් ඔවුන්ට විශේෂ උපකාර අවශ්‍යවන බවත් රාජ්‍යයන් විසින් පිළිගත යුතු වේ.

5.10 රාජ්‍යයන් ඇතුළු සියලුම පාර්ශ්වයන් මහා පරිමාණ සංවර්ධන යෝජනාවලීන් ක්‍රියාවට නැංවීමට පෙර, ජාතික නීති පද්ධතියට අනුවයමින්, බලපෑම් අධ්‍යයනයක් හා අදාල ප්‍රජාවගේ දැනුවත් එකඟතාවක් තුළින් සුළු පරිමාණ ධීවර ප්‍රජාවන් හට ඇතිකරන සමාජීය, ආර්ථික හා පාරිසරික බලපෑම පිළිබඳව සලකා බැලිය යුතුයි.

5.11 රජය විසින් ආපදාවන්ට ලක්විය හැකි හා නොසලකාහැරීමට ලක් වූ කණ්ඩායම් ඇතුළුව සුළු පරිමාණ ධීවර ප්‍රජාවන්ට හා තනි පුද්ගලයින් හට භුක්ති අයිතිවාසිකම් පිළිබඳ ආරවුල් විසඳීමේ ජාතික නීති පද්ධතීන්ට එකඟ විකල්ප ක්‍රම ද ඇතුළත්ව, එම අයිතිවාසිකම් සම්බන්ධ ආරවුල් විසඳිය හැකි කාලීනවූත්, වියදම් දැරිය හැකි සහ ඵලදායීවූත් ක්‍රම මගින් අපක්ෂපාතීවූත්, යෝග්‍ය අධිකරණමය හා පරිපාලන ආයතන හරහා ප්‍රවේශය සපයා දිය යුතු අතර සුදුසු පරිදි අභියාචනා කිරීමේ හිමිකම ද ඇතුළත් විය හැකි ඵලදායී ප්‍රතිකර්ම සලසා දිය යුතුයි. ජාතික නීතින්ට අනුකූලව එවන් ප්‍රතිකර්ම කඩිනමින් බලාත්මක කළ යුතු අතර, එයට ප්‍රතිස්ථාපනය, වන්දිපූරණය,(අලාභ ගෙවීම), සාධාරණ වන්දි ගෙවීම, සහ හානිපූරණය ඇතුළත් කළ හැක.

5.12 ධීවර සම්පත් වල තිරසරභාවය සැලකිල්ලට ගනිමින්, ස්වාභාවික ආපදා හෝ සන්නද්ධ අරගල නිසා අවතැන් වී ඇති සුළු පරිමාණ ධීවර ප්‍රජාවන්ට ඔවුන්ගේ පාරම්පරික ධීවර භූමිවලට සහ මුහුදුබඩ ඉඩම්වලට ඇති ප්‍රවේශය ප්‍රතිස්ථාපනය කරදීමට රාජ්‍යයන් විසින් උත්සාහගත යුතු වේ. දැඩි ලෙස මානව හිමිකම් උල්ලංඝනයට ලක් වූ ධීවර ප්‍රජාවන් හට ඔවුන්ගේ ජීවිත හා ජීවන වෘත්තීන් නගා සිටුවා ගැනීමට අවශ්‍ය සහාය දීම සඳහා රාජ්‍යයන් විසින් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුයි. ස්වාභාවික ආපදා හෝ සන්නද්ධ අරගල සම්බන්ධ එවැනි පියවරයන්හි දී භුක්ති ප්‍රතිපත්තීන්හි කාන්තාවන්ට එරෙහිව ඇති ඕනෑම ආකාරයක වෙනස්කොට සැලකීමක් තුරන් කිරීම ප්‍රවර්ධනය කර සහතික කළ යුතු වේ.

## 5. (ආ) තිරසර සම්පත් කළමනාකරණය

5.13 රාජ්‍යයන් සහ ධීවර කළමනාකරණ ක්ෂේත්‍රයේ නියැළී සිටින සියලුම දෙනා ධීවර සම්පත් දීර්ඝ කාලීන ලෙස සංරක්ෂණය, තිරසර පරිහරණය හා ආහාර නිශ්පාදනය සඳහා වන පාරිසරික පදනම ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ද අනුගමනය කළ යුතු වේ. ඔවුන් විසින් සුළු පරිමාණ ධීවර ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට සහ අවස්ථාවන්ට නිසි පිළිගැනීම ලබාදෙන, වගකිවයුතු ධීවර කර්මාන්තයක් සඳහා වන ආචාර ධර්ම පද්ධතිය ඇතුළුව, ජාතික සහ ජාත්‍යන්තර නීතිය සහ ස්වේච්ඡා වගකීම් යටතේ දැනට පවතින බැඳීම් වලට අනුකූලව සුදුසු කළමනාකරණ පද්ධතීන් ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු වේ.

5.14 අයිතිවාසිකම් සහ වගකීම් යන දෙකම එක්ව එන බව සියලුම පාර්ශ්වයන් පිළිගත යුතු වේ; බුක්ති අයිතිවාසිකම් යුතුකම් මගින් සමබර වන අතර, සම්පත් දීර්ඝ කාලීන ලෙස සංරක්ෂණය කිරීම සහ තිරසර පරිහරණයට ගරු කිරීම හා ආහාර නිශ්පාදනය සඳහා වන පාරිසරික පදනම ආරක්ෂා කිරීම අවශ්‍ය වේ. සුළු පන්න ධීවර කර්මාන්තය සඳහා ජලජ පරිසරයට, හෝ ආශ්‍රිත විශේෂ වලට හානිය අවම කරන හා සම්පත් වල තිරසරභාවයට සහාය වන ධීවර ක්‍රම භාවිත කළයුතු වේ.

5.15 සුළුපන්න ධීවර ප්‍රජාවන් විසින් ඔවුන්ගේ නීත්‍යානුකූල භුක්ති අයිතිවාසිකම් සැලකිල්ලට ගැනීම සඳහා සහ සිය ශුභ සාධනය වෙනුවෙන් තමා යැපෙන සහ සිය ජීවන වෘත්තීන් සඳහා සම්ප්‍රදායිකව භාවිතා කරනු ලබන සම්පත් කළමනාකරණය කිරීම සඳහා වගකීම ගැනීමට හා කළමනාකරණයට හවුල් වීමට රජයයන් විසින් ඔවුන්ව පුහුණු කිරීම, පහසුකම් සැපයීම හා සහාය වීම සිදු කළ යුතුය. එයට අනුකූල වන ලෙස රජයන් විසින්, කාන්තාවන් හා නොසකා හැරීමට ලක් වූ හා ආපදා වලට ලක්විය හැකි කණ්ඩායම් වල සමාන සහභාගීත්වය පිළිබඳව විශේෂ අවධානය සහිතව කළමනාකරණ ක්‍රියා මාර්ග නිර්මාණය කිරීම්, සැලසුම් කිරීම් හා සුදුසු පරිදි ක්‍රියාවට නැංවීම් සඳහා සුළු පන්න ධීවර ප්‍රජාව ඇතුළත් කරගත යුතු අතර ඒ සඳහා ජීවන මාර්ග විකල්පයන් කෙරෙහි බලපාන සංරක්ෂිත කලාප ද ඇතුළත්විය යුතුය. ජාතික නීතීන්ට අනුකූලව සහකළමනාකාරීත්වය වැනි සහභාගීත්ව කළමනාකරණ ක්‍රමද ප්‍රවර්ධනය කළ යුතුය.

5.16 සුළු පන්න ධීවර කර්මාන්තයට යෝග්‍ය හා සුදුසු ආකාරයෙන් ස්ථාපිතව ඇති අධීක්ෂණ, පාලන සහ ආවේක්ෂණ පද්ධති (MCS) නිසි ලෙස ක්‍රියාත්මක වන බවට හෝ අලුතින් ස්ථාපිත කිරීමට රජය විසින් සහතික විය යුතුය. යෝග්‍ය පරිදි සුළුපන්න ධීවර ක්ෂේත්‍ර ක්‍රියාකාරීන් සම්බන්ධ කර ගනිමින් සහ සහකළමනාකරණ සන්දර්භය තුළ සහභාගිත්ව සැකසුම් (පිළිවෙත්) දියුණු කරමින් රජයන් විසින් එවැනි පද්ධතීන් වෙත සහාය ලබා දිය යුතුය. අභ්‍යන්තර හෝ සාමුද්‍රික පරිසර පද්ධතීන් හට නිශේධනාත්මක ප්‍රතිඵල ඇතිකරන විනාශකාරී හා/හෝ නීති විරෝධී ධීවර ක්‍රම ක්‍රියාත්මක කිරීම බාධා කිරීමේ, වැළැක්වීමේ හා සම්පූර්ණයෙන් ම ඉවත් කිරීම සඳහා ඵලදායී අධීක්‍ෂණ හා බලාත්මක කිරීමේ වැඩ පිළිවෙලක් රාජ්‍යයන් විසින් සහතික කළ යුතුයි. ක්‍රියා කාරීත්වයන් ලියාපදිංචි කිරීම වැඩි දියුණු කිරීමට රාජ්‍යයන් උත්සාහ කල යුතුයි. සුළු පරිමාණ ධීවරයින් අධීක්ෂණ, පාලන සහ ආවේක්ෂණ පද්ධති (MCS) වලට සහාය දැක්විය යුතු අතර ක්‍රියා කාරීත්වයන් කළමනාකරණය සඳහා රාජ්‍ය අධිකාරීන්ට අවශ්‍ය තොරතුරු සපයා දිය යුතුය.

5.17 අදාළ පාර්ශ්වයන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ (Stake Holders) සම කළමනාකරණ පිළිවෙත් වල පවතින භූමිකා සහ වගකීම් පැහැදිලිව සහ සහභාගිත්ව ක්‍රියාවලියක් හා නීතිමය සහායක් සහිත ක්‍රියාවලියක් තුළින් එකඟ වූ ඒවා බවටත් රාජ්‍යයන් විසින් ඒත්තු ගැන්විය යුතුය. එකඟත්වය පල කරන ලද කළමනාකරණ කාර්යභාරය පිළිගෙන කටයුතු කිරීම සියලුම පාර්ශ්වයන්ගේ වගකීම වෙයි. එමගින් සුළුපන්න ධීවර ක්ෂේත්‍ර ක්‍රියාකාරීන් අදාළ දේශීය සහ ජාතික වෘත්තිකයින්ගේ ආයතන සහ ධීවර මණ්ඩල තුළ නියෝජනය කරවීමටත්, අදාල සියලු තීරණ ගැනීමේ සහ ධීවර ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලීන් තුළ සක්‍රියව සහභාගි කරවීමටත් සියලු උත්සාහයන් දැරිය යුතුය.

5.18 සහකළමනාකරණයේදී හා වගකීමක් සහිත ධීවර කර්මාන්තය ප්‍රවර්ධනයේ දී, පූර්ව-අස්වනු, අස්වනු නෙලීම සහ පසු - අස්වනු මෙහෙයුම් යන කවර ක්‍රියාවලියක නිරත වුවද, කාන්තා සහ පිරිමි යන දෙපාර්ශ්වයම සතු සුවිශේෂී දැනුම, ඔවුන්ගේ යම් දෙයක ඇති සාපේක්ෂ වැදගත් කම පිළිබඳ අදහස (දෘෂ්ටි කෝනය) සහ අවශ්‍යතා දායක කරගනිමින්, කාන්තා හා පිරිමි දෙපාර්ශ්වයේ ම ක්‍රියා කලාපය සහ මැදිහත් වීම දිරිගැන්වීමටත් එයට සහාය වීමටත් රජයයන් සහ සුළුපන්න ධීවර ක්‍රියාකාරීන් ක්‍රියා කළ යුතුය. කාන්තාවන්ගේ සාධාරණ සහභාගිත්වය සනාථ කිරීමේ අවශ්‍යතාව වෙත සියලුම පාර්ශ්වයන් විශේෂ

අවධානය යොමු කළ යුතු අතර නියමිත කාල රාමු තුළ මෙම අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීම සඳහා විශේෂ පිළියම් සකස් කළ යුතුය.

5.19 දේශසීමා අතර ගැටලු සහ වෙනත් සමාන ගැටලු පවතින (උදා: හවුලේ භුක්ති විඳිනු ලබන ජලාශ සහ ධීවර සම්පත්), අවස්ථාවල රාජ්‍ය අධිකරණ බලය (පාලනය) යටතේ පවතින ප්‍රදේශ වලට අදාළ වන තත්ත්වයන්ට අනුකූලව සුළුපන්න ධීවර ප්‍රජාවන්ගේ භුක්ති විඳීමේ අයිතිවාසිකම් සැලසෙන බවට හා ආරක්ෂා වන බව සනාථ කිරීමට රාජ්‍යයන් එක්ව කටයුතු කළ යුතුය.

5.20 සුළුපන්න ධීවර කර්මාන්තයට පීඩාකාරී ප්‍රතිඵල අත්කරදෙමින් සම්පත් අධිසූරාකෑමකට ලක්කිරීමට දායක වියහැකි ය. කර්මාන්තයේ අධිධාරිතාවක් ඇතිකිරීමට අනුබල දෙන ප්‍රතිපත්තීන් හා මූල්‍යය ක්‍රියාමාර්ග වලින් රාජ්‍යයන් වැළකී සිටිය යුතුයි.

## 6. සමාජ සංවර්ධනය, සේවා නියුක්තිය හා යෝග්‍ය රැකියාවක නිරතවීම

6.1 ජීවනෝපායන්ගේ සංකීර්ණතාව සැලකිල්ලට ගනිමින්, සියලු පාර්ශ්වයන්, සුළුපන්න ධීවර කර්මාන්තය කළමනාකරණයට හා සංවර්ධනයට, පාරිසරිකමය සහ සියලුදෙනා ඇතුළත් ප්‍රවේශයක් පිළිබඳව සැලකිලිමත් විය යුතුය. සුළුපන්න ධීවර ප්‍රජාවන් සවිබල ගැන්වී ඇති බවත් ඔවුන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳීමට ඔවුන්ට හැකි බවත් සහතික කරගැනීමට සමාජ සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

6.2 සෞඛ්‍යය, අධ්‍යාපනය, සාක්ෂරතාව හා අනෙකුත් කුසලතා පුහුණු ලබා දීම වැනිවූ මානව සම්පත් සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීම කෙරෙහි රාජ්‍යයන්හි සහයෝගය ලබා දිය යුතුය. මෙම සේවාවන් මෙන් ම යෝග්‍ය නිවාස, සනීපාරක්ෂාව, බීමට සුදුසු ජලය සහ විදුලිය ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය පොදු සේවාවන් සඳහා සුළුපන්න ධීවර ප්‍රජාවන් හට ලබාගත හැකි බවට රාජ්‍යයන් විසින් සහතික විය යුතු වේ. සමාන ප්‍රතිලාභ ලැබෙන බව සහතික කරගැනීම අවශ්‍ය වන විට සේවා සැපයීමේ දී සහ වෙනස් ලෙස සැලකීමෙන් වැළකීම හා අනෙකුත් මානව හිමිකම් ක්‍රියාවෙහි යෙදවීමේ දී කාන්තාවන් සහ අවදානම් පාත්‍ර හා ආන්තිකරණයට ලක් වූ (අවදානමට ලක් වූ හා නොසලකාහැරීමට ලක් වූ) කණ්ඩායම් වලට විශේෂ සැලකිල්ලක් දැක්වීම පිළිගැනීමට ලක් කර ප්‍රවර්ධනය කළ යුතු වේ.

6.3 සුළුපන්න ධීවර කර්මාන්තය ආශ්‍රිත සේවයේ යෙදෙන්නන් සඳහා සමාජ ආරක්ෂණ රැකවරණයක් ඇතිකිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදිය යුතුය.

6.4 සුළුපන්න ධීවර කර්මාන්තයෙහි ඇති සුවිශේෂී ලක්ෂණ, සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම මගින් සැලකිල්ලට ගත යුතු අතර එවන් යෝජනා ක්‍රම සමස්ත ධීවර අගය දාමයටම අදාළ විය යුතුය.

6.5 සුළුපන්න ධීවර ප්‍රජාවන්ට යෝග්‍ය හා අදාල සේවාවන් සැකසීම හා ඒවාට ප්‍රවේශය සඳහා රාජ්‍යයන් විසින් පියවර ගතයුතුය. උදාහරණ වශයෙන් ඉතුරුම්, ණය හා රක්ෂණ යෝජනා ක්‍රම හා සම්බන්ධ වන කුඩා පරිමාණ ධීවර ප්‍රජාවන් සඳහා උචිත අනෙකුත් සේවාවන් කාන්තාවන් හටද එවන් සේවාවන් සඳහා ඇති ප්‍රවේශය සහතික කිරීම පිළිබඳව විශේෂ අවධාරණයක් සහිතව සංවර්ධනය කිරීමෙහිලා රාජ්‍යයන් විසින් උපකාර ලබා දිය යුතු වේ.

6.6 ජලයේ හෝ ගොඩබිමේ හෝ වේවා, කාන්තාවන් විසින් හෝ පුරුෂයන් විසින් හෝ වේවා, ආර්ථිකයේ විධිමත් අංශයේ හෝ අවිධිමත් අංශයේ වේවා, කුඩා පරිමාණ ධීවර කර්මාන්ත මිල දාමයෙහි (Value Chain) අස්වනු නෙළීමට පෙර හෝ පසු සිදු කරන සමස්ත ක්‍රියාකාරකම් පරාසයම, ආර්ථික හා වෘත්තිමය මෙහෙයුම් වශයෙන් රාජ්‍යයන් විසින් පිළිගත යුතු වේ. අර්ධකාලීනව සිදු කෙරෙන, කලාතුරකින් / යැපුම් සඳහා සිදු කෙරෙන ආදි වූ සියලුම ක්‍රියාකාරකම් සලකා බැලිය යුතු වේ. වඩාත් අවදානම් පාත්‍ර (ආපදාවන්ට ලක්විය හැකි) කණ්ඩායම් වන පසු - අස්වනු ධීවර ශ්‍රමිකයන් හා කාන්තාවන් සඳහා වෘත්තිය සංවර්ධන අවස්ථාවන් විශේෂයෙන්ම ප්‍රවර්ධනය කළ යුතු වේ.

6.6 සුළුපන්න ධීවර අගය දාමයේ පුළුල් පරාසයක් ඇතුළත් වන පූර්ව අස්වනු හෝ පසු අස්වනු අංශයේත්, ජලජ පරිසරයේ හෝ ගොඩබිම දීත් කාන්තාවන් හෝ පිරිමින් විසින් සිදුකරන ආර්ථික හා වෘත්තිමය ක්‍රියාකාරකම් රාජ්‍යයන් විසින් පිළිගත යුතුය.

සියලුම ක්‍රියාකාරකම් සැලකිල්ලට ගත යුතුය. එනම් අර්ධ කාලීන ඉදහිට සිදුකරන හෝ යැපුම් ක්‍රියාකාරිත්වයන් අයත්වේ වෘත්තිමය හා සංවිධාන සංවර්ධන අවස්ථාවන් දිරිගැන්විය යුතුය මෙහි දී විශේෂයෙන් ම ආපදා පාත්‍රී කණ්ඩායම් හෙවත් පසු අස්වනු කටයුතුවල නිරත පිරිස් හා සුළුපන්න ධීවර කර්මාන්තයේ නියුතු කාන්තා කණ්ඩායම් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

6.7 විධිමත් හා අවිධිමත් යන අංශයන් දෙකොට්ඨාශයේ ම අය ඇතුළත් වන ලෙස, සුළු පන්න ධීවර කර්මාන්තයේ සේවයේ යෙදෙන්නන් හට ජීවත් වීමට ප්‍රමාණවත් රැකියාවක් සඳහා රාජ්‍යයන් විසින් අනුග්‍රහය දැක්විය යුතුය. සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවය සහතික කිරීමට රටේ පවතින නීතිරීති වලට අනුකූලවන අයුරින් විධිමත් හා අවිධිමත් යන ධීවර අංශ දෙකෙහි ම ක්‍රියාකාරීත්වයන් සැලකිල්ලට ගැනීම සඳහා රාජ්‍යයන් සුදුසු පරිසරයක් නිර්මාණය කළ යුතුයි.

6.8 ප්‍රමාණවත් හා උසස් ජීවන මට්ටමක් පවත්වා ගැනීමට ජාතික සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලව සේවය කිරීමට ඇති අයිතියට රාජ්‍යයන් විසින් ගරුකළ යුතු වේ. සුළුපන්න ධීවර ප්‍රජාවන්හි තිරසර සංවර්ධනය සඳහා හැකියාව ඇති කරන ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. සියලු දෙනා ම ඇතුළත් කරගන්නා සුළු, වෙනස් ලෙස සැලකීමෙන් වළකින හා ශක්තිමත් ආර්ථික, අභ්‍යන්තර ධීවර කර්මාන්තය හා මුහුදු ධීවර කටයුතු හා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති රාජ්‍යයන් විසින් අනුගමනය කළ යුතු අතර ඒ තුළින් විශේෂයෙන් ම කාන්තාවන් ද ඇතුළුව සුළුපන්න ධීවර ප්‍රජාවන් හට සහ අනෙකුත් ආහාර නිෂ්පාදකයන් හට ඔවුන්ගේ ශ්‍රමය, ප්‍රාග්ධනය හා කළමනාකරණය සඳහා සාධාරණ ප්‍රතිලාභයක් ලැබීමට ඉඩ සලසන අතරම ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසර කළමනාකරණය දිරි ගැන්වෙනු ඇත.

6.9 අවශ්‍ය කරන පරිදි සහ සම්පත් තිරසර ලෙස ප්‍රයෝජනයට ගැනීම හා ජීවනෝපාය විවිධාංගීකරණය සඳහා, කුඩා පරිමාණ ධීවර ප්‍රජාවන් හට ධීවර කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් වලින් උපයන මුදලට අමතරව අනුපූරක සහ විකල්ප ආදායම් උත්පාදනය සඳහා දැනට පවතින අවස්ථාවන් වලට සහාය දීමට සහ තව අවස්ථාවන් ඇති කර දීමට රාජ්‍යයන් සහ ධීවර ක්ෂේත්‍රයෙහි අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් කටයුතු කළ යුතු වේ. ප්‍රාදේශිය ආර්ථිකය තුළ සුළුපන්න ධීවර කර්මාන්තයට ඇති භූමිකාව සහ වඩාත් පුළුල් ආර්ථිකය වෙත මෙම උප අංශයේ ඇති සම්බන්ධතාවන් හඳුනාගෙන ඒවායෙන් ප්‍රතිලාභ අත්පත් කරගත යුතු වේ. ප්‍රජා මූලික සංචාරක කර්මාන්තය සහ කුඩා පරිමාණ හා වගකීමක් සහිතව සිදු කෙරෙන ජලජීවී වගාව ප්‍රවර්ධනයෙන් සුළුපන්න ධීවර ප්‍රජාවන්ට ද සාධාරණ ලෙස ප්‍රතිලාභ ලැබිය යුතු වේ.

6.10 කුඩා පරිමාණ ධීවර ප්‍රජාවන්ට අයත් කාන්තාවන් හා පුරුෂයින් හට අපරාධ වලින් ප්‍රචණ්ඩත්වයෙන්, සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරිත්වයන්, මුහුදු මංකොල්ලයන්, සොරකම්, ලිංගික අපයෝජන, දූෂණ ක්‍රියා හා බලය අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමෙන් තොර පරිසරයක ධීවර කර්මාන්තය සම්බන්ධ ක්‍රියාකාරකම් සිදු කිරීමට හැකි තත්ත්වයන් රජයන් විසින් නිර්මාණය කළ යුතු වේ. සුළු පරිමාන ධීවර ප්‍රජාව තුළ, ගෘහස්ථ හිංසනය ඇතුළු ලිංගික ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම සහ එවන් ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට නිරාවරණය වූ කාන්තාවන් ආරක්ෂා කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ගයන් ගැනීම සඳහා සියලුම පාර්ශවයන් විසින් පියවර ගත යුතු වේ. ගෘහාශ්‍රිතව හෝ ප්‍රජාව තුළ ප්‍රචණ්ඩත්වය හා අපචාර ආදියෙහි වින්දිතයන් බවට පත් වූ පුද්ගලයින් හට සාධාරණත්වය හා යුක්තිය සඳහා ප්‍රවේශය ඇති බවට රාජ්‍යයන් විසින් සහතික කළ යුතු වේ.

6.11 සංක්‍රමණය යනු සුළුපන්න ධීවර කර්මාන්තයේ දී සුලබව දක්නට ඇති ජීවනෝපාය උපක්‍රමයක් හෙයින්, සම්ප්‍රදායික හා චාරිත්‍රානුකූල අධිකාරයන් ද ඇතුළුව රජය හා සුළුපන්න ධීවර කර්මාන්ත ක්‍රියාකරුවන් විසින් සංක්‍රමණික ධීවරයන් හා ධීවර ශ්‍රමිකයන්ගේ භූමිකාව අවබෝධ කරගෙන පිළිගැනීමකට ලක් කර, ගරු කළ යුතු වේ. රාජ්‍යයන් හා සුළුපන්න ධීවර ක්‍රියාකාරීන් විසින්, ජාතික නීතියට එකඟව හා, ධීවර කර්මාන්තයේ සම්පත් තිරසර ලෙස පරිහරණය කිරීමෙහි නිරත වන හා ප්‍රාදේශීය ප්‍රජා මූලික ධීවර කර්මාන්ත පාලනයට හා සංවර්ධනයට බාධා නොපමුණුවන සංක්‍රමිකයන් සඳහා සාධාරණ හා සෑහෙන පමණින් සමාජයට ඒකාබද්ධ කරගත හැකි ක්‍රියාකාරී රාමුවක් හඳුනාගත යුතුය. ජාතික රාජ්‍යයන්හි දේශසීමාවන්ගෙන් එපිටට සංක්‍රමණය වී සුළුපන්න ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින් හා ධීවර සේවකයන් පිළිබඳව අදාල රාජ්‍යයන් සමග සම්බන්ධීකරණයක් ඇතිකරගැනීමේ වැදගත්කම රජය විසින් හඳුනාගතයුතු වේ.. සුළුපන්න ධීවර කර්මාන්තයට සම්බන්ධ සංවිධාන වල සහ ආයතනවල අදහස් ද විමසමින් හා සැලකිල්ලට ගනිමින් අදාල ප්‍රතිපත්තීන් හා කළමනාකරණ ක්‍රමවේදයන් සකසාගත යුතුය.

6.12 මුහුදු සීමාවන් හරහා ගමන් කිරීමට බලපාන පසුබිමේ ඇති හේතු සහ ප්‍රතිවිපාකයන් හඳුනාගෙන ආමන්ත්‍රණය කළයුතු අතර සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවයට බලපාන්නා වූ දේශසීමාවන් අතර ගැටලු සම්බන්ධයෙන් අවබෝධය ඇති කිරීම සඳහා රජය දායක විය යුතු වේ.

6.13 වෙනත් කරුණු ද අතර, තමන් විසින් අත්සන් තබා ඇති විවිධ ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන්, විවිධ ජාත්‍යන්තර මෙවලම් ද ඇතුළුව ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් සඳහා වන ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICESCR) සහ ලෝක කම්කරු සංවිධානයේ අදාල ගිවිසුම් වලට අනුකූල වන පරිදි අවශ්‍ය නීති රීති පනවා ක්‍රියාත්මක වන බව සහතික කරගැනීම මගින් සුළුපන්න ධීවරයින්ගේ වෘත්තිමය සෞඛ්‍යය පිළිබඳ ගැටලු අසාධාරණ සේවා පරිසරයන් පිළිබඳ ගැටලු ආමන්ත්‍රණය කිරීම රාජ්‍යයන් විසින් සිදුකළ යුතුය. එමගින් යාත්‍රා සහ වෙරළ පදනම් කරගෙන කර්මාන්ත වල නියැලෙන සියලුම ධීවර කාර්මිකයන් හා ධීවර ශ්‍රමිකයන් ගේ වෘත්තිමය සෞඛ්‍ය ගැටලු හා සාධාරණ නොවන සේවා තත්ත්වයන් පිළිබඳ ගැටලු ආමන්ත්‍රණය කළ යුතු වේ. ධීවර කර්මාන්ත කළමනාකරණයේ සෑම සංවර්ධන මුලපිරීමක දී ම අත්‍යවශ්‍ය අංගයක් ලෙස වෘත්තිමය සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳව වන අංගය ඇතුළත් වන බවට සහතික කිරීමට සියලුම පාර්ශ්වයන් විසින් උත්සාහ දැරිය යුතු වේ.

6.14 සුළුපන්න ධීවර කර්මාන්තය ද ඇතුළුව ධීවර කර්මාන්තය තුළ බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම සම්පූර්ණයෙන් ම තුරන් කර දැමීමේ අරමුණින් රාජ්‍යයන් විසින් බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම තුරන් කිරීමටත්, ණය පියවා ගැනීම සඳහා කාන්තාවන් පුරුෂයින් හා දරුවන් බලහත්කාරයෙන් වැඩෙහි යෙදවීම වළක්වා ගැනීමටත් ධීවරයින් හා ධීවර ශ්‍රමිකයන් ආරක්ෂා කිරීම සඳහා එලදායී ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතු වේ.

6.15 කුඩා පරිමාණ ධීවර ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලන සහ සියලුම තරුණ තරුණියන් හා පිරිමි ළමුන් හා ගැහැණු ළමුන් හට සමාන අවස්ථාවන් සලසා දෙමින් ඔවුන්ගේ වෘත්තිය මනාපයන්ට සැලකිලි දක්වමින් තරුණ කණ්ඩායම් සඳහා වාසිදායක හා ප්‍රමාණවත් රැකියා අවස්ථා සඳහා පහසුකම් සලසාලන පාසල් හා අධ්‍යාපන පහසුකම් ලබාදීමට හා ඒවාට ප්‍රවේශ වීමට හැකියාව ඇති කිරීමට රාජ්‍යයන් විසින් වග බලා ගත යුතු වේ.

6.16 දරුවන්ගේ සුබසාධනය සහ දරුවන්ගේ මෙන් ම පොදුවේ සමාජයේ ම අනාගතය වෙනුවෙන් අධ්‍යාපනය ලබා දීමේ වැදගත්කම සුළුපන්න ධීවර ක්‍රියාකාරීන් විසින් හඳුනාගත යුතු වේ. දරුවන් පාසල් යා යුතු අතර, සියලුම ආකාරවල අපයෝජනයන්ගෙන් ආරක්ෂා වී, ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අනුකූල වන පරිදි ඔවුන්ගේ සියලුම අයිතිවාසිකම් වලට සැලකිලි දැක්වීමට පාත්‍ර විය යුතු වේ.

6.17 මුහුදේ දී ආරක්ෂාව පිළිබඳ ගැටලුව (අභ්‍යන්තර ජලාශ සහ මුහුදේ කෙරෙන ධීවර කර්මාන්තයේ දී) ඇති සංකීර්ණභාවය සහ ප්‍රමාණවත් ආරක්ෂාවක් නොතිබීම පසුපස ඇති බහුවිධ හේතු සියලු පාර්ශ්වයන් විසින් හඳුනාගත යුතු වේ. මෙය සියලුම ධීවර ක්‍රියාකාරකම් (යාත්‍රා පදනම් කරගත් හා නොගත්) සඳහා අදාල වේ. සුළුපන්න ධීවර කර්මාන්තයේ ධීවර කටයුතු වල දී හා මුහුදේ දී ආරක්ෂාව සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ, ලෝක කම්කරු හා ජාත්‍යන්තර නාවික සංවිධානයේ ජාත්‍යන්තර මාර්ගෝපදේශ වලට අනුකූල වන පරිදි සුදුසු ජාතික නීති හා රෙගුලාසි නිර්මාණය කිරීම. පැනවීම හා ක්‍රියාත්මක වීම සිදුවන බවට රාජ්‍යයන් විසින් වගබලා ගත යුතුය.

6.18 වෘත්තිය සෞඛ්‍යය හා ආරක්ෂාව ද ඇතුළත් වන සුළුපන්න ධීවර කර්මාන්තය (රට අභ්‍යන්තරයේ හා මහමුහුදේ) සඳහා මුහුදේ දී ඉහළ ආරක්ෂාවක් සාක්ෂාත් කර ගැනීම, සුදුසු පරිදි කලාපීය සහයෝගිතා අංගයන් ද සහිතව එකිනෙක හා සම්බන්ධ වූත් ඒකාබද්ධ වූත් ජාතික උපක්‍රම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් සිදු කළ හැකි බැව් රාජ්‍යයන් විසින් හඳුනාගත යුතු වේ. අනෙකුත් කරුණු අතර, සුළුපන්න ධීවර කර්මාන්තයේ ආරක්ෂාව සඳහා ජාතික හදිසි අනතුරු වාර්තාකරණය පවත්වාගෙන යාම, මහමුහුදේ ආරක්ෂාව පිළිබඳ දැනුවත් භාවය ඇති කිරීමේ වැඩසටහන් ලබා දීම සහ සුළුපන්න ධීවර කර්මාන්තයේ දී මහමුහුදේ දී ආරක්ෂාව පිළිබඳව සුදුසු නීතිරීති හඳුන්වා දීම සඳහා රාජ්‍යයන් මගින් සහාය දිය යුතු වේ. අනුකූලතාව වැඩි කිරීම සඳහා දත්ත එක්රැස් කිරීමට, පුහුණු හා දැනුවත්භාවය සඳහා සහ සෝදිසි හා බේරාගැනීමේ මෙහෙයුම් ආදිය සඳහා දැනටමත් පවතින ආයතන හා ප්‍රජා මූලික ව්‍යුහයන් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත යුතු වේ. සුළුපන්න යාත්‍රා මහමුහුදේ දී අනතුරු වලින් මුදවාගෙන ආරක්ෂාව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සඳහා ප්‍රවිෂ්ටයත්, හදිසි ස්ථානගතවීමේ ස්ථානත් හඳුන්වාදීමට රාජ්‍යයන් දිරිගැන්විය යුතුය.

6.19 ජාතික ආහාර සුරක්ෂිතතාවේ සංදර්භය තුළ ඉඩම්, ධීවර කටයුතු හා වනාන්තර වගකීමක් සහිතව භුක්තිවිදීම සඳහා සකසා ඇති ස්වේච්ඡා මාර්ගෝපදේශනයේ 25 වන වගන්තිය[8] සැලකිල්ලට ගනිමින් ආයුධ සන්නද්ධ අරගලයන්හි පැටලී ඇති ප්‍රදේශයන්හී ජීවත්වන සියලුම සුළුපන්න ධීවර පාර්ශ්වකරුවන්ගේ මානව හිමිකම් හා ගරුත්වයන් ජාත්‍යන්තර මානුෂීය නීතියට අනුකූලව තමන්ගේ

8. ඉඩම්, ධීවර හා වනාන්තරවලට අදාල භුක්තියේ අයිතිය පිළිබඳව ගැටුම්කාරීත්වයන්

පාරම්පරික ධීවර භූමි පරිහරණයට ඉඩදීමෙන් හා පාරම්පරික ධීවර භූමි සඳහා ප්‍රවිෂ්ටයට ඉඩදීමෙන් සහ ඔවුන්ගේ සංස්කෘතිය හා ජීවන රටාවන් සුරක්ෂිත කිරීමෙන් සිදුකළ යුතුය. තමන්ට බලපාන සියලු තීරණ ගැනීමේ අවස්ථාවලදී ඔවුන්ගේ විධිමත් සහභාගිත්වය සඳහා පහසුකම් සැලසිය යුතුය.

## 7. අගය දාමයන්, පසු අස්වනු හා වෙළෙඳාම

7.1 සම්පත් උපයෝජනය (සැපයුම) සහ පරිභෝජනය (ඉල්ලුම) අතර ඇති සම්බන්ධතාව නිර්මාණය කරමින් සුළුපන්න ධීවර කර්මාන්තයේ පසු අස්වනු උප අංශය හා එහි ක්‍රියාකාරීන් විසින් මිල දාමයෙහි සිදු කරන කේන්ද්‍රීය භූමිකාව සියලු පාර්ශ්වයන් විසින් හඳුනාගත යුතු වේ. අගය දාමයෙහි ක්‍රියාකාරීන් අතර අසමතුලිත බල සම්බන්ධතා ඇතැම්විට පවතින බවත්, ආපදාපාත්‍රී හා ආන්තික (ආපදාවන්ට ලක්විය හැකි හා නොසලකාහැර ඇති) කණ්ඩායම් සඳහා විශේෂ උපකාර අවශ්‍ය විය හැකි බවත් පිළිගන්නා අතරම පසු - අස්වනු ක්‍රියාකාරීන් ද අදාළ තීරණ ගැනීමේ කර්තවයන්හිදී සම්බන්ධ වන බවට සියලු පාර්ශ්වයන් විසින් සහතික කර ගත යුතු වේ.

7.2 පසු - අස්වනු උප අංශය තුළ කාන්තාවන් විසින් නිරන්තරයෙන් ඉටු කරනු ලබන භූමිකාව සියලු අංශ විසින් පිළිගැනීමට ලක් කර, එකී ක්‍රියාකාරීත්වයන්ට කාන්තාවගේ දායකත්වය සඳහා පහසුකම් සැලසීම වැඩි දියුණු කිරීමට උපකාර කළ යුතු වේ. කාන්තාවන් හට පසු - අස්වනු උප අංශයේ ඔවුන්ගේ ජීවනෝපාය පවත්වාගෙන යාම සහ වැඩි දියුණු කරගැනීම සඳහා අවශ්‍ය හා යෝග්‍ය පරිදි කාන්තාවන්ට ගැලපෙන පහසුකම් සහ සේවාවන් පවතින බවට රාජ්‍යයන් විසින් සහතික කළ යුතු වේ.

7.3 අපනයන මෙන් ම දේශීය වෙළෙඳපොල සඳහා හොඳ තත්ත්වයේ සහ ආරක්ෂිත මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වගකිව යුතු හා තිරසර අන්දමින් නිෂ්පාදනය කිරීමට, සුළුපන්න ධීවර කර්මාන්තයේ පසු අස්වනු උප අංශයට සහාය දීම හා ධෛර්යය දීමත් සඳහා රාජ්‍යයන් විසින් සුදුසු යටිතල පහසුකම්, යෝග්‍ය සංවිධාන ව්‍යුහයන් හා ශක්‍යතා වර්ධනය යන අංශ වල ආයෝජනය කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම හා හැකියාව ඇති කිරීම සිදු කළ යුතු වේ.

7.4 ජාතික නීති පද්ධතියට අදාලව, ධීවරයන්ගේ සහ ධීවර කාර්මිකයින්ගේ ආදායම හා ජීවනෝපාය සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීමට රාජ්‍යයන් හා සංවර්ධන හවුල්කරුවන් විසින් ධීවරයන්ගේ හා ධීවර කම්කරුවන්ගේ සාම්ප්‍රදායික ක්‍රමයේ සංවිධාන ව්‍යුහයන් පිළිගත යුතු අතර, අගය දාමයෙහි සියලු අදියරයන්හි සිටින සුළුපන්න ධීවර ශ්‍රමිකයන් සඳහා සංවිධානමය හා හැකියාවන් සංවර්ධනය ප්‍රවර්ධනය කළ යුතු වේ. ඒ අනුව, සමූපකාර සමිති සහ සුළු පන්න ධීවර ක්ෂේත්‍රයේ වෘත්තීය සංගම්, අනෙකුත් සංවිධානාත්මක ව්‍යුහයන්ගේ මෙන් ම වෙළෙඳ යාන්ත්‍රණයන් ද (උදාහරණ ලෙස සුදුසු පරිදි වෙන්දේසි පොලවල්), සංවර්ධනය හා පිහිටුවා ගැනීම සඳහා සහාය දිය යුතු වේ.

7.5 පවතින සාම්ප්‍රදායික හා දේශීය පිරිවැය කාර්යක්ෂම තාක්ෂණයන්, දේශීය නවෝත්පාදන සහ සංස්කෘතික වශයෙන් උචිත තාක්ෂණ පැවරීම් වැඩි දියුණු කරමින් පසු අස්වනු හානිය අවම කිරීමට හා අගයන් එකතු කිරීමේ ක්‍රම සොයා ගැනීමට සියලු පාර්ශ්වයන් විසින් උත්සාහ කළ යුතු වේ.  කුඩා පරිමාණයෙන් මත්ස්‍ය සම්පත් යොදා ගනිමින් පිරිසැකසුම් කිරීමේ දී, පාරිසරික වශයෙන් තිරසර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරමින් පාරිසරික ක්‍රියාමාර්ග තුළ, යෙදවුම් නාස්ති කිරීම වැනි දෑ (ජලය, දැව ආදිය) වළක්වමින් කටයුතු කළ යුතු වේ.

7.6 සුළු පන්න මත්ස්‍ය හා ධීවර නිෂ්පාදනයන්ට සමානාත්මතාවෙන් හා යුක්තිසහගතවත්  සහ වෙනස් ලෙස සැලකීමෙන් වලකින අන්දමේ වෙළෙඳාම ප්‍රවර්ධනය කරමින් ප්‍රාදේශීය, ජාතික, කලාපීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීම සඳහා පහසුකම් සැලසීම  රාජ්‍යයන් විසින් සිදු කළ යුතු වේ. කුඩා පරිමාණ ධීවර කර්මාන්ත නිෂ්පාදන කලාපීය වශයෙන් වෙළෙඳාම් කිරීමට සහාය වන, ලෝක වෙළෙඳ සංගමයේ ස්ථාපිත ගිවිසුම් වලට අනුව එහි විධි නියෝග, මූලධර්ම, අයිතීන් හා බැඳීම් සමගින් අනුකූලතාව දක්වන වෙළෙඳ රෙගුලාසි හා ක්‍රමවේදයන් හඳුන්වා දීම සඳහා රාජ්‍යයන් විසින් සහයෝගයෙන් කටයුතු කළ යුතු වේ.

7.7 ජාත්‍යන්තර වශයෙන් මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන වල වෙළෙඳාමේ යෙදීමෙන් සිදුවන බලපෑම පිළිබඳ නිසි අවධානය යොමුකිරීමත් දේශීය සුළුපන්න ධීවරයින්, ධීවර කම්කරුවන් හා ඔවුන්ගේ ප්‍රජාවන් අතර සිරස් අනුකලනයෙහි ඇතිවිය හැකි සෘජු ප්‍රතිඵල පිළිබඳව අවබෝධ කරගැනීමට රාජ්‍යයන් විසින් උත්සාහ කළ යුතු වේ. ජාත්‍යන්තර මත්ස්‍ය වෙළෙඳාම සහ නිෂ්පාදන  අපනයනය ප්‍රවර්ධනය

කිරීම තුළින්, ආහාරයේ අවශ්‍යතාවන් පිළිබඳ බරපතල අවධානමක් සහිත ජනතාවගේ පෝෂණ යට අහිතකර බලපෑමක් සිදුනොවන බවටත්, ඔවුන්ගේ සෞඛ්‍යය හා යහපැවැත්ම මෙන් ම වෙනත් මත්ස්‍ය නිෂ්පාදනයන්ට සම කළ හැකි ආහාර මූලාශ්‍ර පහසුවෙන් ලබාගත නොහැකි හෝ දරාගත හැකි මිලකට ලබා ගත නොහැකි නිසාවෙන් සමබර පෝෂණයක් සහිත ආහාර වේලක් සඳහා මත්ස්‍යයින් ආහාරයට ගැනීම කෙරෙහි අහිතකර ප්‍රතිඵලයක් ඇති නොකරන බවටත් රජයන් විසින් සහතික කරගත යුතු වේ.

7.8 රාජ්‍යයන්, සුළුපන්න ධීවර ක්‍රියාකාරීන් හා අගය දාමයෙහි අනෙකුත් ක්‍රියාකාරීන් විසින් ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යනබව සහතික විය යුතුය. ජාත්‍යන්තර වෙළෙඳපලේ වැඩිවන ඉල්ලුම මගින් ඇතිවන සම්පත් අධි සූරාකෑම මගින් ධීවර සම්පත්වල තිරසර බවට, ආහාර සුරක්ෂිතතාවට සහ පෝෂණයට තර්ජනයක් වීම වැළැක්වීම සඳහා, ඵලදායී ධීවර කළමනාකරණ පද්ධතියක් ස්ථානගත කිරීමට රජය සහතික විය යුතුය.

එවැනි ධීවර කළමනාකරණ පද්ධතීන් තුළ වගකීමක් සහිත පසු අස්වනු භාවිතයන්, ප්‍රතිපත්තීන් හා ක්‍රියාකාරීත්වයන් මගින් ලබන අපනයන ආදායම මගින් සුළුපන්න ධීවර කාර්මිකයන් සහ අන්අය ප්‍රතිලාභ ලබන බවටත් අගය දාමය පුරාම සමාන අයුරින් ප්‍රතිලාභ බෙදීයන බවටත් ඇතුළත් විය යුතුය.

7.9 පාරිසරික සහ සමාජ ඇගයීම් ද ඇතුළුව අනෙකුත් අදාල ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සම්මත කරගැනීම මගින්, ජාත්‍යන්තර වෙළෙඳාම හරහා පරිසරයට, සුළුපන්න ධීවර කර්මාන්ත ජීවනෝපායට හා සංස්කෘතියට සහ ආහාර සුරක්ෂිතතාවට මෙන් ම විශේෂ අවශ්‍යතා සඳහා ඇති කරන අහිතකර බලපෑම් යුක්ති සහගත ලෙස ආමන්ත්‍රණය කරන බැව් රාජ්‍යයන් විසින් සහතික කළ යුතු ය. මේ පිළිබඳව සැලකිල්ලක් දක්වන පාර්ශ්වකරුවන්ගෙන් අදහස් විමසීම ද මෙම ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටින්හි කොටසක් විය යුතුය.[9]

7.10 සුළුපන්න ධීවර කර්මාන්ත අගය දාමයෙහි සිටින පාර්ශ්වකරුවන් හට, සියලු, අදාල වෙළෙඳපල හා වෙළෙඳ තොරතුරු සඳහා ප්‍රවේශය ලබාදීමට රාජ්‍යයන් විසින් කටයුතු කළ යුතු වේ. ඔවුන් හට වෙනස්වන වෙළෙඳපල තත්ත්වයන්ට අනුව

9. වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් සඳහා වන 'ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ' තාක්ෂණ මාර්ගෝපදේශනයෙහි 61 වගන්තිය 1 මත පදනම්ව ඇති (අංක 11 වගකිව යුතු මත්ස්‍ය වෙළෙඳාම)

හැඩ ගැසීම සඳහා සහාය වීමට සුළුපන්න ධීවර කර්මාන්ත පාර්ශ්වකරුවන් හට කාලීන හා නිවැරදි වෙළෙඳපල තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රවේශය තිබිය යුතු වේ. විය හැකි සෘණාත්මක බලපෑම් අවම කර ගනිමින් ගෝලීය ප්‍රවනතාවන් හා ප්‍රාදේශීය තත්ත්වයන් හට අනුවර්තනය වීමට සහ ඒවායින් සමාන ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සුළුපන්න පරිමාණ ධීවර ශ්‍රමිකයන්ගේ, විශේෂයෙන් ම කාන්තාවන් සහ ආපදාපාත්‍ර හා ආන්තික කණ්ඩායම් වල හැකියාවන් වර්ධනය කිරීම අවශ්‍ය වේ.

## 8. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව

8.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සාක්ෂාත් කරගැනීම සඳහා සියල්ලන් ම සහයෝගයෙන් උත්සාහ දැරීම අවශ්‍ය බවත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ධාරාව තුළ සමාජ ගත කිරීම සියලුම සුළුපන්න ධීවර කර්මාන්ත සංවර්ධන උපක්‍රමයන්හි අත්‍යාවශ්‍ය කොටසක් විය යුතු බවත් සියලුම පාර්ශ්වයන් විසින් පිළිගත යුතු වේ. මෙම උපක්‍රම සංස්කෘතික සංවේදී විය යුතු අතර විවිධාකාර වූ සංස්කෘතික පසුබිම් වල දී මේ සඳහා විවිධාකාර එළඹුම් අවශ්‍ය වීමට ඉඩ ඇති අතර කාන්තාවන්හට වෙනස්කොට සැලකීමේ ක්‍රියාකාරකම් වලට එරෙහිව අභියෝග කළයුතුය.

8.2 රාජ්‍යයන් විසින් තමන් ද පාර්ශ්වකරුවන් වන අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර, විශේෂයෙන් ම CEDAW, Beijing Declaration, Platform for Action ඇතුළු අදාල මෙවලම් ක්‍රියාත්මක කළ යුතුය. සුළුපන්න ධීවර කර්මාන්තය සම්බන්ධ ප්‍රතිපත්ති පිළිබඳව තීරණ ගැනීමේ ක්‍රියාවලියට කාන්තාවන් සමාන ලෙස සම්බන්ධ කරගැනීමට රජයදැඩිලෙස උත්සාහගත යුතුය. සිවිල් සංවිධාන සඳහා, විශේෂයෙන් ධීවර කාන්තා සේවකයන් හා ඔවුන්ගේ සංවිධාන වලට, ක්‍රියාත්මක භාවය අධීක්ෂණය සඳහා අවකාශය සපයමින් රජය විසින්, කාන්තාවන්හට වෙනස්කොට සැලකීම එරෙහි, විශේෂිත ක්‍රියාමාර්ග ගොඩනැගිය යුතුය. එමෙන්ම ධීවර කර්මාන්තය හා සම්බන්ධ සංවිධානවලට සහභාගි වීම සඳහා කාන්තාවන් දිරිමත් කළ යුතු අතර අදාළ සංවිධානයන්ට සංවර්ධන සහාය සැපයිය යුතුය.

8.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමානතාව අත්පත් කරගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමක් සහ නීති පැනවීමක් සිදුවන බවට රාජ්‍යයයන් වග බලාගත යුතු අතර සමාජයීය, ආර්ථික හා සංස්කෘතික අංශයන් සැලකිල්ලට

ගනිමින් ස්ත්‍රී පුරුෂ සමානතාව හා අනුකූල නොවන ඕනෑම ප්‍රතිපත්තියක් හෝ නීති පද්ධතියක් සංශෝධනය කළ යුතුය. වෙනත් කරුණු අතර, ව්‍යාප්ති සේවාවන්හි කාර්යමණ්ඩලය වශයෙන් පිරිමින් සහ කාන්තාවන් යන දෙපාර්ශ්වයම බඳවාගැනීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදී ධීවර තාක්ෂණ සහ වෙනත් අංශ පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව ලබාදීම සහ පිරිමි සහ කාන්තා දෙපාර්ශ්වයටම ධීවර කර්මාන්තය හා සම්බන්ධ ව්‍යාප්ති සහ තාක්ෂණික සේවාවන්ට ප්‍රවේශ වීමේ සමාන හැකියාව සනාථ කිරීම යනාදිය සිදුකරමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමානතාව වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේ දී රාජ්‍යයයන් ප්‍රමුඛස්ථානය ගත යුතුය.

8.4 සුළුපන්න ධීවර කර්මාන්තයේ කාන්තා සේවාවන් සඳහා උචිතවන හා වැදගත්වන වඩාත් යෝග්‍ය තාක්ෂණයක් නිර්මාණය කිරීමට සියලු පාර්ශවයන් දිරිගැන්විය යුතුයි.

## 9. ආපදා අවදානම සහ දේශගුණික විපර්යාස

9.1 තිරසර සුළුපන්න ධීවර කර්මාන්තයේ සන්දර්භය තුළ, දේශගුණික විපර්යාසයන් සමග සටන් කිරීම විසින් හදිසි සහ බලාපොරොත්තු සහගත ක්‍රියාත්මක වීමක් ඉල්ලා සිටින බව රාජ්‍යයන් විසින් පිළිගත යුතුය. මෙකී ක්‍රියාත්මක වීම සිදුකළ යුත්තේ තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ (රියෝ +20) සමුලුවේදී ප්‍රතිඵල වූ "අපට අවශ්‍ය අනාගතය" යන ලේඛනය සැලකිල්ලට ගනිමින් දේශගුණික විපර්යාසය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික ක්‍රම සම්මුතිය (UNFCCC) හි අඩංගු විධිවිධාන, මූලධර්ම සහ අරමුණුවලට අනුකූලව ය.

9.2 ස්වභාවික විපත් සහ මිනිසා විසින් ඇතිකළ විපත්වලින් ඇතිවන බලපෑම් එකිනෙකට වෙනස් බවත් දේශගුණික විපර්යාසයන් නිසා සුළුපන්න ධීවර කර්මාන්තයෙන් යැපෙන අයට වන බලපෑමත් සියලු පාර්ශවයන් විසින් පිළිගත යුතු සහ සැලකිල්ලට ගත යුතු වේ. විශේෂයෙන් ම අනුවර්තනය වීම සහ සංසිඳවීම සඳහාත් හැකි පරිදි ප්‍රකෘතිතත්වයට යළිපත්වීම සඳහාත් විශේෂිත ක්‍රමෝපායයන් සහිතව රාජ්‍යයන් විසින් ධීවර කර්මාන්තයේ දී දේශගුණික විපර්යාසවල බලපෑම ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ සැලසුම් සංවර්ධනය කළ යුතුය. මේ සඳහා ආදිවාසී ජනතාව, ස්ත්‍රී පුරුෂයන් ද ඇතුළත්ව ධීවර ප්‍රජාව සමග පූර්ණ සහ බලාත්මක උපදේශනයක් පවත්වමින්, අවදානම්

සහිත තත්වයක පසුවන සහ කොන් වූ කණ්ඩායම්වලට විශේෂ අවධානයක් යොමුකරමින් සිදුකළ යුතුය. දේශගුණික විපර්යාස විසින් ආහාර සුරක්ෂිතතාව, පෝෂණය, නිවාස සහ ජීවනෝපාය වෙත විශේෂ බලපෑම් සිදුකරන කුඩා දූපත් හි වෙසෙන්නන් හට විශේෂ සහයෝගයක් ලබාදිය යුතුය.

9.3 සුළුපන්න ධීවර කර්මාන්තයේ දේශගුණික විපර්යාස සහ ආපදා විපත් ආමන්ත්‍රණය කිරීම සඳහා විවිධ අංශ අතර සහයෝගය ඇතුළත් ව ඒකාබද්ධ සහ සාකල්‍ය ප්‍රවේශයන් අනුගමනය කිරීමේ අවශ්‍යතාව සියලු පාර්ශ්වයන් විසින් පිළිගත යුතුය. මිනිසාගේ පෙළඹවීම් නිසා-ධීවරමය නොවන සාධක හේතුවෙන් සිදුවන දූෂණය, මුහුදු ඛාදනය සහ වෙරළබඩ නිකේතන විනාශ වීම ධීවර බිම් හානිවීම වැනි ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා රාජ්‍යයන් හා සෙසු අදාළ පාර්ශවයන් නිසි පියවර ගත යුතුය. මෙවැනි ගැටලු විසින් ධීවර ප්‍රජාවගේ ජීවනෝපායට මෙන්ම දේශගුණික විපර්යාසවල බලපෑම්වලට හැඩගැසීම සඳහා ඔවුන් සතු හැකියාවට ද බරපතළ ලෙස හානි කිරීමක් සිදුවෙයි.

9.4 යෝග්‍ය අවස්ථාවන්හි දී අනුවර්තනය, සංසිඳවීම සහ ආධාර සැලසුම් ඇතුළත් ක්‍රියාමාර්ග හරහා දේශගුණික විපර්යාසවලින් හෝ ස්වභාවික සහ මිනිසා මුල් වී සිදුකරන විපත්වලින් හානියට පත් සුළුපන්න ධීවරයන් හට සහයෝගය දැක්වීම හා ආධාර කිරීම පිළිබඳ රාජ්‍යයන් සලකා බැලිය යුතු වේ.

9.5 මිනිසුන් විසින් ඇති කළ විපත් සුළුපන්න ධීවර කර්මාන්තයට බලපාන අවස්ථාවන්හිදී අදාළ වගකිවයුතු පාර්ශ්වය ඒ සඳහා වගවිය යුතුය.

9.6 මත්ස්‍ය විශේෂ සහ සංඛ්‍යාත්මක ප්‍රමාණයන්, මත්ස්‍යයන්ගේ ගුණාත්මකභාවය සහ කවච ජීවීන්ගේ වෙනස්කම් සිදුවීම හරහා පසු අස්වනු හා වෙළෙඳ උප අංශ කෙරෙහි දේශගුණික විපර්යාස හා විපත් බලපෑ හැකි බවත්, එම බලපෑම් වෙළෙඳපොළ සමග පවතින බද්ධතාවන්ට බලපාන බවත් සියලු පාර්ශවයන් විසින් සැලකිල්ලට ගත යුතුය. සෘණාත්මක අහිතකර බලපෑම් අඩු කිරීම සඳහා සීරුමාරුවෙන් පියවර ගැනීමට සුළුපන්න ධීවර කර්මාන්තයේ කොටස්කරුවන්ට රාජ්‍යයන් විසින් සහයෝගය ලබාදිය යුතුය. නව තාක්ෂණය හඳුන්වා දුන් විට දී, ඒවා ධීවර විශේෂයන්ට, ධීවර නිෂ්පාදනවලට සහ වෙළෙඳපොළ වෙතටද දේශගුණික විවිධත්වය වෙතට ද නම්‍යශීලී වීම සහ අනුවර්තනය වීම අවශ්‍ය වේ.

9.7 හදිසි ප්‍රතිචාර සහ විපත් සඳහා සූදානම් වීම් සුළුපන්න ධීවර කර්මාන්තයට සම්බන්ධ වන්නේ කෙසේද යන්න සහ සහන සංවර්ධන අඛණ්ඩතාවයේ සංකල්පය යෙදෙන ආකාරය රාජ්‍යයන් විසින් තේරුම්ගත යුතු වේ. දීර්ඝකාලීන සංවර්ධන අරමුණු හදිසි අවස්ථා අනුක්‍රමය යටතේ සලකා බැලිය යුතු වේ. හදිසි සහන අදියර, සහ පුනරුත්ථාපනය, නැවත ගොඩනැංවීම සහ යථා තත්වයට පත් කිරීම යන්නට අනාගතයේ ඇතිවිය හැකි තර්ජන සඳහා තිබෙන අවදානම අඩුකිරීම සඳහා වූ ක්‍රියාමාර්ගයන් ද ඇතුළත් වේ. ආපදා ප්‍රතිචාරයන්හි දී සහ පුනරුත්ථාපනයන්හි දී "building back better" යන සංකල්පය යෙදිය යුතු ය.

9.8 දේශගුණික විපර්යාසට සම්බන්ධිත පරිශ්‍රමයන්හි දී සුළුපන්න ධීවර කර්මාන්තයේ භූමිකාව සියලු පාර්ශ්වයන් විසින් ප්‍රවර්ධනය කළ යුතුය. තවද උප අංශයේ මත්ස්‍ය අස්වනු නෙලීම, පසු අස්වනු, අලෙවිය සහ බෙදාහැරීම ඇතුළත්ව සමස්ත අගය දාමය තුළ බලශක්ති කාර්යක්ෂමතාව දිරිමත් කළ යුතුය.

9.9 දේශගුණික විපර්යාස අනුවර්තනය සඳහා අරමුදල්/පහසුකම් සහ/හෝ සංස්කෘතිකමය වශයෙන් යෝග්‍ය තාක්ෂණයන් යෝග්‍ය පරිදි යොදාගැනීමේ දී සුළුපන්න ධීවරයන් හට විනිවිදභාවයකින් යුතු ප්‍රවේශයක් ලැබෙන සේ ඒවා සිදුකිරීම පිළිබඳ රාජ්‍යයන් විසින් සලකා බැලිය යුතු ය.

# තුන්වන කොටස :

# මාර්ගෝපදේශන බලගන්වන පරිසරයක් සාක්ෂාත් කිරීම සහ ක්‍රියාවට නැංවීම සඳහා සහාය දීම.

## 10. ප්‍රතිපත්තිවල ගැළපීම, ආයතනික සම්බන්ධීකරණය සහ සහයෝගීතාව

10.1 වෙනත් කරුණු අතර ජාතික නීති සම්පාදනය, අන්තර්ජාතික මානව හිමිකම් නීතිය; ආදිවාසී ජනතාව පිළිබඳ ඇතුළත් සෙසු අන්තර්ජාතික ලේඛන; ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති ; බලශක්තිය, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ ග්‍රාමීය ප්‍රතිපත්ති; පරිසරය සුරැකීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ ප්‍රතිපත්ති; කම්කරු සහ රැකියා නියුක්තිය පිළිබඳ ප්‍රතිපත්ති; වෙළෙඳ ප්‍රතිපත්ති; ආපදා අවදානම කළමනාකරණය (DRM) සහ දේශගුණික වෙනස්කම්වලට හැඩගැසීම (CCA) පිළිබඳ ප්‍රතිපත්ති; ධීවර කර්මාන්තය වෙත ප්‍රවේශ වීමේ කළමනා කටයුතු, සහ වෙනත් ධීවර අංශ ප්‍රතිපත්ති; සැලසුම්, ක්‍රියාමාර්ග සහ සුළුපන්න ධීවර කර්මාන්තයේ සාකල්‍ය වැඩිදියුණු වීම් ප්‍රවර්ධනය කිරීම සඳහා සිදුකරන ආයෝජන සම්බන්ධයෙන් ප්‍රතිපත්තිවල ගැළපීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාව සහ ඒ වෙනුවෙන් කටයුතු කළ යුතු බව රාජ්‍යයන් විසින් පිළිගත යුතු ය. මෙහි දී විශේෂ අවධානයක් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව හා සාධාරණත්වය සහතික කිරීම පිළිබඳව යොමුකළ යුතුය.

10.2 අභ්‍යන්තර ජලාශ සහ සාගර අවකාශය සැලසුම් කිරීම ඇතුළත් ව සුළුපන්න ධීවර කර්මාන්තයේ අභිලාෂයන් නිසි ලෙස සැලකිල්ලට ගනිමින් සහ ඒකාබද්ධ වෙරළබඩ කලාප කළමනාකරණය කරමින් රාජ්‍යයන් විසින් සුදුසු පරිදි අවකාශමය සැලසුම් ප්‍රවේශයන් සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම සිදුකළ යුතු ය. නියාමනය කළ අවකාශ සැලසුම් ක්‍රම මත උපදේශනය, සහභාගිත්වය සහ ප්‍රසිද්ධ කිරීම මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වූ ප්‍රතිපත්ති සහ නීති හරහා එය සුදුසු පරිදි සංවර්ධනය කළ යුතු ය. යෝග්‍ය විට දී, සුළුපන්න ධීවරයන් සහ චාරිත්‍රානුකූල භුක්තික පද්ධති සහිත සෙසු ප්‍රජාවන් භාවිතා කරන සැලසුම් ක්‍රම සහ දේශභූමීය සීමා සංවර්ධනය සහ මේ ප්‍රජාවන් තුළ වන තීරණ ගැනීමේ ක්‍රමවේදයන්, විධිමත් සැලසුම් පද්ධතිවලින් සලකා බැලිය යුතුය.

10.3 සාගරයේත්, අභන්තර ජලාශයන්හි සහ පරිසර පද්ධතිවල ස්වස්ථතාව සඳහා බලපාන ප්‍රතිපත්ති ඒකාත්මික කිරීම සඳහා රාජ්‍යයන් විසින් සුදුසු, විශේෂිත ප්‍රතිපත්තිමය පියවර සකස් කර ගත යුතු වන අතර, කෘෂිකර්මාන්තය සහ සෙසු ස්වභාවික සම්පත් ප්‍රතිපත්ති වලින්, මේ අංශවලින් බිඳී එන අන්තර් සම්බන්ධතා සහිත ජීවනෝපායයන් සාමූහික ලෙස වැඩිදියුණු කර තත්වයෙන් උසස් කරන බවට රාජ්‍යයන් සහතික විය යුතුය.

10.4 පරිසර පද්ධති පදනම් කරගත් එළඹුමක් භාවිතා කිරීම මගින් සැකසූ ධීවර ප්‍රතිපත්ති විසින් සුළුපන්න ධීවර කර්මාන්තයේ, දිළිඳු බව හා සාගින්න මුලිනුපුටා දැමීමට දිගු කාලීන දැක්මක් සපයන බවට රාජ්‍යයන් සහතික විය යුතුය. ධීවර කර්මාන්තයේ සමස්ත රාමුව සුළුපන්න ධීවර කර්මාන්තයට සහ මානව හිමිකම්වලට, අවදානමට ලක්වීමේ ඉඩ ඇති සහ කොන් වූ පුද්ගලයන් හට විශේෂ අවධානයක් යොමුකරමින් ප්‍රතිපත්තිමය රාමුවක් සහ දිගුකාලීන දැක්මක් සැපයිය යුතු වේ.

10.5 දේශීය-ජාතික-කලාපීය හා ගෝලීය සම්බන්ධතා සහ ජාල ඇතුළත්ව, ප්‍රතිපත්ති වල ගැළපීම, අන්තර් අංශ සමෝධානය සහ ධීවර අංශය කෙරෙහි සාකල්‍ය හා පරිසර පද්ධති අන්තර්ග්‍රහණය කළ ආයතනනික ව්‍යුහයන් සංස්ථාපනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට රාජ්‍යයන් කටයුතු කළ යුතු වේ. මේ අතරම වගකීම් සඳහා පැහැදිලි ව වගකිව යුත්තන් හඳුනාගැනීමේ අවශ්‍යතාවයක් තිබෙන අතර සුළුපන්න ධීවර ප්‍රජාවන් සඳහා රජයේ බලධාරීන් හා නියෝජිතයන් ඉතා පැහැදිලි ලෙස සම්බන්ධ කර ගත හැකි විය යුතු ය.

10.6 සුළුපන්න ධීවර කර්මාන්තයේ පාර්ශ්වකරුවන් විසින් ධීවර සමුපකාර සමිති සහ සිවිල් සංවිධාන ඇතුළත් ව සිය වෘත්තීය සංගම් අතර සමෝධානිත බව ප්‍රවර්ධනය කළ යුතුය. අත්දැකීම් හා තොරතුරු හුවමාරු කර ගැනීමටත් සුළුපන්න ධීවර ප්‍රජාවන්ට අදාළ ව ප්‍රතිපත්ති-තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ඔවුන්ගේ දායකත්වය වැඩිදියුණු කිරීමටත් ජාල සහ වේදිකා ඔවුන් විසින් සකස් කළ යුතුය.

10.7 පරිසර පද්ධතික ප්‍රවේශයක් සැලකිල්ලට ගනිමින් සහ ජාතික නීතිය සමග අනුකූලවෙමින් සුළුපන්න ධීවර කර්මාන්තයේ බලාත්මක කළමනාකරණයක් වෙත දායකවීම සඳහා පළාත් පාලන ව්‍යුහයන්ට ඇති හැකියාව පිළිගැනීම සහ යෝග්‍ය පරිදි දිරිගැන්වීම රාජ්‍යයන් විසින් සිදුකළ යුතුය.

10.8 තිරසර සුළුපන්න ධීවර කර්මාන්තය සුරකීමට, වැඩිදියුණු කළ අන්තර්ජාතික, කලාපීය සහ උප කලාපීය සහයෝගයක් රාජ්‍යයන් විසින් විකසනය කළ යුතු වේ. රාජ්‍යයන් මෙන් ම අන්තර්ජාතික, කලාපීය සහ උපකලාපීය සංවිධාන ද, සුළුපන්න ධීවර කර්මාන්තය අවබෝධ කර ගැනීමට සහයවන, හැකියා සංවර්ධනයට යෝග්‍ය පරිදි සහාය දැක්විය යුතු වන අතර යෝග්‍ය හා සුහද ලෙස එකඟතාවකින් යුතු වූ තාක්ෂණය මාරු කර ගැනීමේ දී උප කලාපීය, කලාපීය හෝ අන්තර්ජාතික සහයෝගයෙන් යුතුව එකී උප අංශයේ ගැටලු විසඳාගැනීමට උපකාර කළ යුතුය.

## 11. තොරතුරු, පර්යේෂණ සහ සන්නිවේදනය

11.1 මත්ස්‍ය ගහනයන් පිළිබඳව ද ඇතුළත් ව පරිසර පද්ධතිවල තිරසරභාවය සාක්ෂාත් කරන දැක්මකින් සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසර කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීම සඳහා අදාළ වන ජීව පරිසර විද්‍යාත්මක, සමාජයීය, සංස්කෘතික සහ ආර්ථික දත්ත ද ඇතුළත් ව ධීවර දත්ත එක්රැස් කිරීම සඳහා රාජ්‍යයන් විසින් විනිවිද භාවයෙන් යුතු ක්‍රමෝපායන් ස්ථාපිත කළ යුතුය. ස්ත්‍රීපුරුෂ සමාජ භාවය කෙරෙහි සමුච්චිත නොවූ දත්ත මෙන් ම සමාජ, ආර්ථික අංශයන් ද ඇතුළුව සුළුපන්න ධීවර කර්මාන්තයේ සහ එහි එකිනෙකට වෙනස් සංරචකවල වැදගත් භාවයේ දෘශ්‍යභාවය සහ වඩා වැඩි අවබෝධයක් සඳහා ඉඩ ලබාදෙන දත්ත නිල සංඛ්‍යා ලේඛනවල දී ඉදිරිපත් කිරීමට ද උත්සාහ කළ යුතු ය.

11.2 සියලු පාර්ශ්වකරුවන් සහ සුළුපන්න ධීවර ප්‍රජාව, බලාත්මක තීරණ ගැනීමක් සඳහා අත්‍යවශ්‍ය වන සන්නිවේදනයේ සහ තොරතුරුවල වැදගත්භාවය පිළිගත යුතුය.

11.3 විශේෂයෙන් ම විනිවිදභාවය වැඩිකිරීම මගින්, තීරණ ගන්නන් වගවීමට ලක්කිරීම තුළින්, සහ අපක්ෂපාතී තීරණ ශීඝ්‍රයෙන් හා යෝග්‍ය සහභාගිත්වයකින් යුතුව, කඩිනමින් සුළුපන්න ධීවර ප්‍රජාව වෙත සන්නිවේදනය හරහා නිකුත් කිරීම මගින් දූෂණ වළක්වන බවට රාජ්‍යයන් පරිශ්‍රමය දැරිය යුතු ය.

11.4 සුළුපන්න ධීවර ප්‍රජාව දැනුම සහිත වූවන්, දැනුම සපයන්නන් සහ දැනුම ලබන්නන් ලෙස සියලු පාර්ශවයන් පිළිගත යුතු ය. පවතින ගැටලු පිළිබඳ කටයුතු කිරීමටත්, ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමටත්, සුළුපන්න ධීවර ප්‍රජාවන් ට උදව්කිරීම සඳහා ධීවර ප්‍රජාව සහ ඔවුන්ගේ සංවිධානවලට සුදුසු පරිදි තොරතුරුවලට ප්‍රවේශ වීමේ අවශ්‍යතාව තිබෙන බව අවබෝධ කර ගැනීම අතිශයින් වැදගත් ය. ප්‍රජාවන් මුහුණපාන වත්මන් ගැටලු සහ ධීවර කර්මාන්තයේත්, ජීවනෝපායේත් ජීව විද්‍යාත්මක, නීති, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අංශ පිළිබඳ ගැටලු මත මෙකී තොරතුරු අවශ්‍යතාව රඳා පවතියි.

11.5 නීතිවිරෝධී, වාර්තා නොවන සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීම (IUU) ඇතුළත් ව වගකිවයුතු සුළුපන්න ධීවර කර්මාන්තයක් සහ තිරසර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය තොරතුරු ලබාගත හැකි බව රාජ්‍යයන් විසින් සාක්ෂාත් කළ යුතුය. එය වෙනත් දේ අතර, අවදානම් තත්වයක පසුවන්නන් හා කොන්වූවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින්, විපත් අවදානම්, දේශගුණික විපර්යාස, ජීවනෝපාය සහ ආහාර සුරක්ෂතතාව සමග බද්ධ විය යුතු ය. දත්ත හීන අවස්ථාවන්හි දී අඩු දත්ත අවශ්‍යතාවලින් යුත් තොරතුරු ක්‍රමවේදයන් වැඩිදියුණු කළ යුතුය.

11.6 දැනුම, සංස්කෘතිය, සම්ප්‍රදායයන් සහ ස්වදේශීය ජනතාව ද ඇතුළත්වන සුළුපන්න ධීවර ප්‍රජාවන්ගේ පරිචයන් පිළිගන්නා බවට සහ යෝග්‍ය පරිදි සහාය දක්වන බවටත්, ඔවුන් විසින් අදාළ වගකිව යුතු ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහයන්ට සහ තිරසාර සංවර්ධන ක්‍රියාවලිය වෙත දැනුම් දිය යුතු වන බවටත් සියලු පාර්ශවයන් සහතික විය යුත්තේය. ධීවර කාර්මිකයන්ට සහ ධීවර කාන්තාවන්ට ඇති සුවිශේෂී දැනුම අවබෝධ කරගනිමින් සහය විය යුතුය. තිරසර ධීවර සංරක්ෂණය, කළමනාකරණය සහ සංවර්ධනය සඳහා ධීවරයන්ගේ සම්ප්‍රදායික දැනුම සහ තාක්ෂණයේ භාවිතයන් තක්සේරු කිරීම පිණිස රාජ්‍යයන් විසින් ඒවා විමර්ශනය කර ලේඛනගත කළ යුතු ය.

11.7 විශේෂයෙන්ම ස්වදේශීය ජනතාව, කාන්තාවන් සහ විශේෂයෙන් යැපුම් ආර්ථිකයක් තුළ ධීවර කර්මාන්තයේ යෙදෙන්නන් ඇතුළත් ව යෝග්‍ය පරිදි ඔවුන්ට සංවිධානයවීමට, පවත්වාගෙනයාමට, ජලජ සජීවී සම්පත් හා ධීවර තාක්ෂණය පිළිබඳ සම්ප්‍රදායික දැනුමත්, ජලජ පරිසර පද්ධතීන් පිළිබඳ දැනුම

වැඩිදියුණු කර ගැනීමට සහ හුවමාරු කර ගැනීම සඳහා තාක්ෂණික හා මූල්‍යමය අවශ්‍යතාවයන්ට රාජ්‍යයන් සහ සෙසු අදාළ පාර්ශවයන් සහාය දැක්විය යුතුය.

11.8 තිරස් සහ සිරස් ද්විමාර්ගික තොරතුරු ගලායාම ඇතුළත් ව ප්‍රජා, ජාතික, උප කලාපීය සහ කලාපීය මට්ටමෙන් දැනට තිබෙන වේදිකා අවකාශයන් සහ ජාලගතවීම් භාවිතා කරමින් හෝ ඒවා ස්ථාපිත කිරීම හරහා, අන්තර්රාජ්‍ය සීමාවන්ට අදාල ජලජ සම්පත් ද ඇතුළත් ව තොරතුරු ලබාගත හැකිවීම, ඒවා ගලායාම සහ හුවමාරුව සියලු පාර්ශවයන් විසින් ප්‍රවර්ධනය කළ යුතු ය. සමාජ සහ සංස්කෘතික මානයන් සැලකිල්ලට ගනිමින් සුළුපන්න ධීවර ප්‍රජාවගේ හැකියා සංවර්ධනය සහ සංනිවේදනය සඳහා සුදුසු ප්‍රවේශයන්, මෙවලම් සහ මාධ්‍යයන් භාවිතා කළ යුතු ය.

11.9 හැකි උපරිම මට්ටමින්. සුළුපන්න ධීවර කර්මාන්තයේ පර්යේෂණ සඳහා අරමුදල් තිබෙන බවට රාජ්‍යයන්  සහ වෙනත් පාර්ශවයන් සහතික විය යුතු අතර, සමෝධානිත සහ සහභාගිත්ව දත්ත එක්රැස් කිරීම. විශ්ලේෂණය සහ පර්යේෂණ දිරිමත් කළ යුතු ය. රාජ්‍යයන් සහ සෙසු පාර්ශව මෙම පර්යේෂණ දැනුම ඔවුන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා යොදාගැනීමට උත්සාහ ගත යුතු ය. සුළුපන්න ධීවර ප්‍රජාවන්ට පර්යේෂණ සඳහා සහභාගි වීමට සහ පර්යේෂණයේ සොයාගැනීම් උපයෝගී කිරීම සඳහා හැකියා වර්ධනයට පර්යේෂණ ආයතන සහ සංවිධාන සිය සහයෝගය ලබාදිය යුතු ය. ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය, දිළිඳුකම මුලිනුපුටා දැමීම, සමානාත්මතා සංවර්ධනය, ආපදා අවධානම කළමනාකරණය **[DRM]** සහ දේශගුණික විපර්යාස අනුවර්තනය **[CCA]** ප්‍රතිෂ්ඨාවන් ඇතුළත් ව තිරසර සම්පත් උපයෝජනයේ දී සුළුපන්න ධීවර කර්මාන්තයේ භූමිකාව වෙත කේන්ද්‍රගත වූ උපදේශාත්මක ක්‍රියාදාමයක් හරහා පර්යේෂණ ප්‍රමුඛතාවන් හඳුනාගැනීම සිදුකළ යුතුය.

11.10 රාජ්‍යයන් හා සෙසු අදාළ පාර්ශ්වයන් විසින් සංක්‍රමික ධීවර කම්කරුවන් සහ ධීවර කම්කරුවන් ඇතුළත්ව, ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ සන්දර්භය තුළ ධීවර කර්මාන්තයේ නියැළී සිටින ස්ත්‍රීන්ට සහ පුරුෂයන් ට සමාන ප්‍රතිලාභ ලැබීම තහවුරු කිරීම සඳහා ක්‍රමෝපායන් දැනුම් දීම පිණිස වැඩ තත්වය, සෞඛ්‍යය, අධ්‍යාපනය, තීරණ ගැනීම ආදිය සම්බන්ධයෙන් පර්යේෂණ ප්‍රවර්ධනය කළ යුතු ය. සුළුපන්න ධීවර කර්මාන්තය සඳහා ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති නිර්මාණය කිරීමේ අදියරේ දී ස්ත්‍රීපුරුෂ සමාජභාවයට සංවේදී වූ මැදිහත්වීම් නිර්මාණය කිරීම සඳහා ස්ත්‍රීපුරුෂ සමාජභාවය ප්‍රධාන ධාරාව බවට පත්කිරීමේ

පරිශ්‍රමයන්ට ස්ත්‍රීපුරුෂ සමාජභාවය විශ්ලේෂණය කිරීම ඇතුළත් කළ යුතු ය. ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ විෂමතා සහ එකී මැදිහත්වීම් සමාජ වෙනසක් සඳහා දායක වන්නේ කෙසේද යන්න ආමන්ත්‍රණය කිරීමට හා අධීක්ෂණය කිරීම සඳහා ස්ත්‍රීපුරුෂ සමාජ භාවය වෙත සංවේදී වූ දර්ශක යොදාගත යුතුය.

11.11 මුහුදු ආහාර නිෂ්පාදනයේ දී සුළුපන්න ධීවරයන්ගේ භූමිකාව හඳුනාගනිමින්, මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මය තක්සේරු කරන ආකාරය පිළිබඳ දැනුම සහ මාළු ආහාරයට ගැනීමේ පෝෂණ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් වීම ඉහළ දැමීම සඳහා, පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන් තුළ මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම රාජ්‍යයන් සහ සෙසු පාර්ශවයන් විසින් සිදුකළ යුතු ය.

## 12. හැකියා සංවර්ධනය

12.1 තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී සහභාගි විය හැකි වන සේ සුළුපන්න ධීවර ප්‍රජාවගේ හැකියාවන් රාජ්‍යයන් සහ සෙසු පාර්ශවයන් විසින් වැඩිදියුණු කළ යුතු ය. මෙය බලාත්මක කිරීම සඳහා සුළුපන්න ධීවර කර්මාන්ත උප අංශයේ නිත්‍යානුකූල, ප්‍රජාතාන්ත්‍රික සහ නියෝජිත ව්‍යුහයන් නිර්මාණය කිරීමේ දී, විවිධත්වය හා පරාසය, නීති සම්පාදන සම්පූර්ණ අගය දාමය ම සමග නිසි පරිදි නියෝජනය වන බවට සහතික විය යුතු ය. එවැනි ව්‍යුහවල දී ස්ත්‍රීන්ගේ සමාන සහභාගිත්වය සඳහා වූ වැඩකටයුතුවලට විශේෂ අවධානයක් යොමුකළ යුතු ය. ස්ත්‍රීන්ට විශේෂ අදාළත්වයක් ඇති ගැටලු පිළිබඳ විවිධාකාර මට්ටම්වල දී ස්වාධීන ව සංවිධානය වීමට සුදුසු සහ අත්‍යාවශ්‍ය අවස්ථාවන්හි දී එකිනෙකට වෙනස් අවකාශයන් සහ යාන්ත්‍රණ ඒ සඳහා සැපයිය යුතු ය.

12.2 රාජ්‍යයන් සහ සෙසු පාර්ශ්වකරුවන් විසින් සංවර්ධන වැඩසටහන් හරහා සුළුපන්න ධීවර කර්මාන්තයට ප්‍රවේශ විය හැකි වන සේ සහ වෙළෙඳපොල අවස්ථාවන්ගෙන් ප්‍රතිලාභ ලබාගත හැකි වන සේ හැකියා වර්ධනයට අවස්ථාව සැපයිය යුතු ය.

12.3 පවත්නා දැනුම සහ කුසලතා මත හැකියා සංවර්ධනය ගොඩනැගිය යුතු බවත්, එය කාන්තාවන් හා පුරුෂයන් යන දෙපිරිසම සහ කොන් වූ සහ ආපදාපාත්‍රී

පුද්ගලයන් ඇතුළත්ව, පුද්ගල අවශ්‍යතා ඉටුකරන, දැනුම හුවමාරු කිරීමේ දෙයාකාර ක්‍රියාවලියක් බවත් පිළිගත යුතු ය. තවද හැකියා සංවර්ධනයට, ආපදා අවධානම කළමනාකරණය [DRM] සහ දේශගුණික විපර්යාස අනුවර්තනය [CCA] ට අදාළව සුළුපන්න ධීවර ප්‍රජාවන්ට උපයෝජනය කළ හැකි හැකියාවන් සහ ප්‍රකෘති තත්වයට නැවත පත්වීම ඇතුළත් විය යුතු ය.

12.4 යෝග්‍ය පරිදි, තිරසර සුලු පරිමාණ ධීවර කර්මාන්තයේ සංවර්ධනය සහ යෝග්‍ය පරිදි සාර්ථක සම කළමනාකාරිත්වයක් සැකසීම සඳහා ආණ්ඩුවේ බලධාරීන් සහ සියලු මට්ටම්වල නියෝජිතායතන දැනුම සහ කුසලතා සංවර්ධනය සඳහා කටයුතු කළ යුතු ය. පාලනය සහ සංවර්ධන ක්‍රියාදාමය සමග පර්යේෂණ ක්ෂේත්‍රය ද ඇතුළත් ව සුළුපන්න ධීවර කර්මාන්තයට සම්බන්ධ වූ විමධ්‍යගත වූ සහ ප්‍රාදේශීය පාලන ව්‍යූහයන් ට විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

## 13. ක්‍රියාවට නැංවීම සඳහා සහයෝගය සහ අධීක්ෂණය

13.1 මෙකී මාර්ගෝපදේශනයන් ජාතික ප්‍රමුඛතාවන්ට සහ ආශ්‍රිත වටපිටාවට අනුකූල ව ක්‍රියාවට නංවන සේ සියලු පාර්ශවයන් දිරිමත් කෙරේ.

13.2 මූල්‍ය සම්පත් ඵලදායී ලෙස සහ වගකීම්සහගත ලෙස භාවිතා කිරීම රාජ්‍යයන් සහ සෙසු සියලු පාර්ශවයන් විසින් ප්‍රවර්ධනය කළ යුතුය. සංවර්ධන සහකරුවන්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂඥ නියෝජිතවරුන් සහ දකුණු-දකුණු සහයෝගිතාව ඇතුළු කලාපීය සංවිධාන, රාජ්‍යයන් විසින් මෙකී මාර්ගෝපදේශනයන් ක්‍රියාවට නැංවීම සඳහා ගනු ලබන ස්වෛච්ඡා උත්සාහයන්ට සහාය ලබාදීම පිණිස දිරිමත් කෙරේ. මෙබඳු සහාය දැක්වීම්වලට තාක්ෂණික සහයෝගිතාව, මූල්‍ය උපකාර, ආයතනික හැකියා සංවර්ධනය, දැනුම බෙදාහදා ගැනීම සහ අත්දැකීම් හුවමාරුව, ජාතික සුළුපන්න ධීවර කර්මාන්ත ප්‍රතිපත්ති සංවර්ධනයට සහ තාක්ෂණය හුවමාරු කර ගැනීමට සහාය වීම ඇතුළත් වේ.

13.3 මෙකී මාර්ගෝපදේශනයන් සරල කර ප්‍රසිද්ධ කිරීම සහ පරිවර්තනය කිරීම මගින් ද, සුළුපන්න ධීවර කර්මාන්තයේ නියැළී සිටින්නන්ගේ ප්‍රතිලාභ සඳහා මෙකී මාර්ගෝපදේශනයන් පිළිබඳ දැනුවත්භාවය ඇතිකිරීම පිණිස රාජ්‍යයන් සහ සෙසු සියලු පාර්ශවයන් එකට එක් වී වැඩ කළ යුතු ය. සුළුපන්න ධීවර

කර්මාන්තයේ දී ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ තොරතුරු ඵලදායී ලෙස ප්‍රසිද්ධියට පත් කිරීම සුරකිනු පිණිස සහ කාන්තාවන්ගේ තත්වය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ රැකියාව ඉහළ නැංවීමටත් ගත යුතු ක්‍රියාමාර්ග ඉස්මතු කර දක්වමින් රාජ්‍යයන් සහ සෙසු සියලු පාර්ශවයන් ස්ත්‍රීපුරුෂ සමාජ භාවය පිළිබඳ විශේෂිත අමුද්‍රව්‍ය/ලේඛන/පත්‍රිකා කට්ටලයක් සකස් කළ යුතු ය.

13.4 මෙකී මාර්ගෝපදේශනයන් ගේ නිර්දේශ සහ අරමුණු ක්‍රියාවට නැංවීම පිළිබඳ දියුණුව තක්සේරු කිරීම පිණිස සිය ආයතනවලට පිවිසිය හැකි අධීක්ෂණ ක්‍රමවල වැදගත්කම රාජ්‍යයන් විසින් පිළිගත යුතු ය. ජාතික ආහාර සුරක්ෂිතතාවේ සන්දර්භය සහ දිළිඳුකම පිටුදැකීම යටතේ ප්‍රමාණවත් පරිදි ආහාර ලබාගැනීමේ අයිතිය ප්‍රගතිගාමී ලෙස ඉටු කර ගැනීම භුක්තිවිඳින අන්දම පිළිබඳ තක්සේරුව ද මෙයට ඇතුළත් කළ යුතු ය. ප්‍රතිපත්ති සැකසීම සහ ක්‍රියාවට නැංවීම පිළිබඳ ප්‍රතිපෝෂණයේ ප්‍රතිඵල අධීක්ෂණය කිරීමට ඉඩ දෙන යාන්ත්‍රණයන් ද මෙයට ඇතුළත් කළ යුතු ය. ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය වෙත සංවේදී ප්‍රවේශයන්, දර්ශක සහ දත්ත භාවිතා කරමින් අධීක්ෂණයේ දී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සැලකිල්ලට ගත යුතුය. ස්ත්‍රීන් හා පුරුෂයන් යන දෙපාර්ශවයම ඇතුළත් ව දිළිඳු බව මුලිනුපුටා දැමීම සහ ආහාර සුරක්ෂිතතාව සඳහා සුළුපන්න ධීවර කර්මාන්තය තිරසර සම්පත් කළමනාකරණය වෙත දායක කිරීම ලේඛනගත කරමින්, වඩා හොඳ අවබෝධයක් ලබාගැනීමට ඉඩදෙන සහභාගිත්ව තක්සේරු ක්‍රමවේදයන් රාජ්‍යයන් සහ සියලු පාර්ශ්වයන් විසින් විස්තර වශයෙන් දැක්විය යුතුය.

13.5 අංශ එකිනෙක හරහා නියෝජනයක් සහිත සහ සිවිල් සංවිධානයන්හි ප්‍රබල නියෝජනයක් සහිත ව මාර්ගෝපදේශනයන් ක්‍රියාවට නැංවෙන අයුරු සුදුසු පරිදි අධීක්ෂණය කිරීම පිණිස රාජ්‍යයන් විසින් ජාතික තලයේ වේදිකාවන් සකස් කළ යුතුය. සුළුපන්න ධීවර ප්‍රජාවගේ නීත්‍යානුකූල නියෝජිතයන් මෙම මාර්ගෙ ෝපදේශනයන් සැකසීමේ දී සහ මාර්ගෝපදේශනයන් සඳහා වන ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීමේ දී ද අධීක්ෂණයේ දී ද සම්බන්ධ විය යුතුය.

13.6 මෙකී මාර්ගෝපදේශනයන් ක්‍රියාවට නැංවීමට සහාය ලබාදෙන කලාපීය ක්‍රියාකාරී සැලසුම් සමග ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය ගෝලීය සහයෝගීතා වැඩසටහනක් සංවර්ධනය කිරීම සඳහා සහාය දැක්වීම සහ එය ප්‍රවර්ධනය කිරීම කළ යුතු වේ.

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් 1995 දී සකසන ලද, වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් සඳහා ආචාර ධර්ම පද්ධතියට ඌන පූරකයක් ලෙසින් මෙන්ම සහයක ක්‍රියාවලියක් ලෙසින් ආහාර සුරක්ෂිතතාව හා දිළිඳුකම පිටුදැකීමේ සන්දර්භය තුළ සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවය සුරක්ෂිත කිරීම සඳහා වන ස්වේච්ඡා මගපෙන්වීම් මාලාව සකසන ලදී. මේවා සැකසීම මගින් ආචාර ධර්ම පද්ධතියේ සමස්ථ මූලධර්මයන්ට හා අන්තර්ගත කොන්දේසින්ට අනුපූරක ලෙසින් සුළුපන්න ධීවර කර්මාන්තයට අදාලව සැලකිය යුතු මගපෙන්වීමක් සිදුකරයි. මෙම මගපෙන්වීම් වලට අනුව දැනටමත් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන සුළුපන්න ධීවර කර්මාන්තයේ දෘෂ්‍යභාවය පිළිගැනීම හා ප්‍රවර්ධනය සිදුකිරීම මෙන්ම ගෝලීයව හා ජාතික වශයෙන් සිදුකරන දිළඳුබව පිටුදැකීමට හා බඩගින්න තුරන් කිරීමට ගන්නා ප්‍රයත්නයන්ට දායක වීමටද අපේක්ෂා කරයි. මෙම මගපෙන්වීම් මාලාව මගින් වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් සඳහා සහය වීමක් මෙන්ම වත්මන් හා අනාගත පරම්පරාවන්ට තිරසර සමාජ සහ ආර්ථික සංවර්ධන ප්‍රතිලාභ අත්පත් කර දීමටත් සුළු පන්න ධීවරයින්ට හා ධීවර කම්කරුවන්ටත්, ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ අවධාරණයකින් යුතුව ආපදාපාත්‍රී ජනයා සහ ආන්තික ජනකොටස් ද ඇතුලත්ව සියල්ලන් සඳහා මානව හිමිකම් පාදක කරගත් උපාය මාර්ගයක් දිරිගන්වනු ලැබේ.

ISBN 978-955-8103-25-8